

# ප්‍රජා සවිබල ගැන්වීමේ ගමනක්

## කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම



9 789559 055549

# පටුන


| | |
|---|---|
| ආයුබෝවන්! | 3 |
| ව්‍යාපෘතිය කෙටියෙන් | 4 |
| කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ප්‍රවේශය | 5 |
| හැඳින්වීම | 6 |
| සක්‍රීය පුරවැසි ක්‍රමවේදය | 9 |
| ප්‍රධාන කොටස්කරුවන් | 11 |
| කාන්තා හඬ | 15 |
| පිරිමි හඬ | 19 |
| තරුණ හඬ | 21 |
| ප්‍රජා සුසාධ්‍යකාරකයින්ගේ / පුහුණුකරුවන්ගේ හඬ | 23 |
| රජයේ පාර්ශවකරුවන්ගේ හඬ | 25 |
| ජාතික සමුළුව | 27 |
| නිර්දේශ | 28 |
| සම්බන්ධීකාරකවරු | 29 |
| සහභාගීත්වය | 30 |
| සක්‍රීය පුරවැසි හඬ | 31 |
| හදිසි ඇමතුම් අංක | 33 |

# ප්‍රජා සවිබල ගැන්වීමේ ගමනක්

## කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම

බ්‍රිතාන්‍ය කවුන්සිලය සමඟ හවුල්කරුවන් ලෙස ක්‍රියාකරන ලද්දේ:

FISD

# GENERATION පරපුර தலைமுறை

Janathakshan

JSAC

# ආයුබෝවන්!



**ජිල් කැල්ඩිකට්,**
ශ්‍රී ලංකා අධ්‍යක්ෂිකා,
බ්‍රිතාන්‍ය කවුන්සිලය - ශ්‍රී ලංකාව,
(2017 අගෝස්තු - 2020 අගෝස්තු)

මා මේ පොත් පිංච සඳහා පෙරවදන ලියන්නේ ඉමහත් සතුටකිනි. 'ප්‍රජා සවිබල ගැන්වීමේ ගමනක් - කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම' යනු පසුගිය වසර දෙකහමාරක කාලය පුරාවට ක්‍රියාත්මක වූ මෙම ව්‍යාපෘතියේ කතා පුවත්, උගත් පාඩම් හා නිර්දේශ සංග්‍රහයකි. මෙම ව්‍යාපෘතිය වඩාත් සුවිශේෂී වන්නේ එය ග්‍රාමීය ප්‍රජාවන්හි කාන්තාවන් හා තරුණ පිරිස් හා සම්බන්ධ වී සක්‍රීය පුරවැසියන්ගේ ක්‍රමවේදය (Active Citizens Methodology) භාවිතා කරමින් ප්‍රජාවන් තුල ධනාත්මක වෙනසක් ඇති කිරීමට ඔවුන් සවිබල ගැන්වූ නිසාවෙනි. මෙයට කදිම උදාහරණ රැසක් මෙම පොත් පිංචෙහි අඩංගු වේ.

අප කවුරුත් දන්නා පරිදි කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාවට හෝ ආසියාවට පමණක් සීමා නොවන ගෝලීය ගැටලුවකි. මෙයට හේතු වන්නේ කාන්තාවන් හා සමාජය තුල ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳව සමාජය තුළ ගැඹුරින් මුල් බැසගත් යල්පැනගිය ආකල්ප, සමාජ සම්මතයන් හා සිතීමේ ක්‍රමය. මෙමගින් කාන්තාවන්ගේ මානව හිමිකම් කඩවේ. මෙයට එරෙහිව හඬ නැගීම පහසු කාර්යයක් නොවේ. අප බලාපොරොත්තු වන වෙනස කරා පහසුවෙන් හෝ ඉක්මනින් ළඟා විය නොහැකි නමුත් එම වෙනස කරා යන මෙම ගමනට බ්‍රිතාන්‍ය කවුන්සිලය දායක වීම මට මහත් සතුටකි. බ්‍රිතාන්‍ය කවුන්සිලය පසුගිය වසර කිහිපය පුරාවට ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ කාර්යයන්හි බොහෝ සේ නිරතව ඇත. ගෝලීය වශයෙන් අපි මෙය දකින්නේ ප්‍රමුඛවතාවය ලැබිය යුතු වැදගත් කාරණාවක් ලෙසයි. ශාරීරික හෝ මානසික හිංසනයට ලක්වේයයි යන බියෙන් තොර නොවන තාක් කාන්තාවන්ට සමාජය තුල ඔවුන්ට හිමි විය යුතු නිසි තැන අත්කර ගත නොහැක. අපගේ මෙම සහයෝගීතාවයේ ප්‍රධාන කාර්යභාරය සිදුකල නවෝත්පාද සමාජ සංවර්ධන පදනමට (Foundation for Innovative Social Development – FISD) මාගේ විශේෂ ස්තූතිය පුද කරන අතර අපගේ අනෙකුත් හවුල්කරුවන් වන යාපන සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය (Jaffna Social Action Centre - JSAC), ජනතාක්ෂන් සංවිධානය (Janathakshan) හා හෑශ්ටැග් පරපුරට (Hashtag Generation) මාගේ ස්තූතිය පුද කරමි. මෙසේ අප එක්ව සිදුකල කාර්යය යා යුතු නිවැරදි දිශාවට ගත් එක් පියවරක් වන අතර අප හට සමාජය තුල කාන්තාවන්ගේ අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමට අවස්ථා තවදුරත් හිමිවේයයි මම බලාපොරොත්තු වෙමි.



# වයාපෘතිය කෙටියෙන්




**2018 - 2020**

ගෝලීය ගැටලුවක් වන කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනයට ශ්‍රී ලංකාව තුළ විසඳුම් සෙවීමට සාමූහිකව ක්‍රියාමාර්ග ගැනීම සඳහා වසර දෙකක් පුරාවට ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවන්හි ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරමින් ඔවුන් සවිබල ගන්වා ඇත.

දිස්ත්‍රික්ක
**4ක්**

ගම්මාන
**6ක්**
(කොට්ඨාස 6 ක් තුළ)

පුහුණුකරුවන්
**13ක්**

ප්‍රජාවන්
**20ක්**

කාන්තාවන්
**150ක්**

සක්‍රීය පුරවැසියන්
**450ක්**

තරුණ තරුණියන්
**300ක්**

පිරිමින් දැනුවත් කිරීමේ සැසි හරහා පිරිමි පුද්ගලයින්
**150ක්**
සෘජුව සම්බන්ධ විය

ප්‍රජා ප්‍රතිලාභීන්
**1800ක්**

ප්‍රජා මැදිහත්වීම් / සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති
**40ක්**

සේවා සපයන්නන්
**200ක්**
සම්බන්ධ වූ ආකාර


දිස්ත්‍රික් සම්මන්ත්‍රණ
**3ක්**

ජාතික සමාජ මාධ්‍ය ව්‍යාපාරය
**1ක්**

ජාතික සමුළුව
**1ක්**

# කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ප්‍රවේශය

කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම පිලිබඳ වෙනස් වීමේ න්‍යායට අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවයන්ට ආකාර කිහිපයකින් විසඳුම් සපයන අතර පාර්ශවකරුවන් විශාල පරාසයකින් ඒ සඳහා සම්බන්ධ කර ගත හැක.



# හැඳින්වීම



1993 කාන්තා හිංසනය වැළැක්වීමේ ප්‍රකාශනයේ අර්ථදැක්වීමට අනුව කාන්තාවන් ශාරීරිකව හෝ ලිංගිකව හෝ මානසිකව හිංසනයට ලක්කරන තර්ජන හෝ බලකිරීම් හෝ අත්තනෝමතිකව ඔවුන්ගේ නිදහස අහිමිකිරීම ඇතුලත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට අදාළ, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලික ජීවිතය තුළ සිදුවන ඕනෑම ක්‍රියාවක් කාන්තා හිංසනය ලෙස අර්ථ දක්වයි.

Care International හි වාර්තාවකට අනුව පුරුෂයින්ගෙන් 36% ක් තම කාන්තා සහකාරිය ශාරීරිකව හා ලිංගිකව හිංසනයට ලක්කර ඇති බවත්, 6% ක් තම සහකාරිය නොවන කාන්තාවක් ශාරීරිකව හා ලිංගිකව හිංසනයට ලක් කර ඇති බවත්, 17% ක් ස්ත්‍රී දූෂණයද ඇතුළත්ව ලිංගික හිංසනයට කාන්තාවන් ලක්කර ඇති බවත් අනාවරණය වී ඇත. ශ්‍රී ලංකා පොලිස් වාර්තා වලට අනුව 2012 හා 2013 වසරවල ස්ත්‍රී දූෂණ හා ව්‍යාභිචාර සිදුවීම් පිලිවෙලින් 2150ක් හා 2175ක් වාර්තා වී ඇත. බොහෝ අවස්තාවන්හිදී වැරදිකරුවන් ගෘහස්ථ සාමජිකයන් වන නිසා මෙවන් සිදුවීම් ඉතා කලාතුරකින් වාර්තාවේ.

'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' යන ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාව තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ලිංගික හිංසාකාරී සංස්කෘතියට විසඳුම් සෙවීමට අදහස් කරන ලදී. ඒ සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලය නවෝත්පාද සමාජ සංවර්ධන පදනම හා එක්වූ අතර ප්‍රධාන උපායමාර්ග හා බෙදාහැරීමේ හවුල්කරු ලෙස නවෝත්පාද සමාජ සංවර්ධන පදනම ප්‍රාදේශිය ප්‍රජාවන්ට සම්බන්ධ වීමට, යාපන සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය, ජනතාක්ෂන් සංවිධානය (Janathakshan) සහ හෑශ්ටැග් පරපුර (Hashtag Generation) හා එක්ව හවුල්කරුවන්ගේ එකමුතුවක් ගොඩනගන ලදී. ඔවුන් එක්ව බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සක්‍රීය පුරවැසියන්ගේ ආකෘතිය ඇසුරින් ව්‍යාපෘතිය දියත් කිරීමට ආකෘතියක් සකස් කරන ලදී. එය තෝරාගත් ප්‍රජාවන්හි කාන්තාවන් හා ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට විසඳුම් සෙවීමේ තේමාව මූලික කරගත් නායකත්ව කුසලතා හා විශ්වාසය හා අවබෝධය වැඩිදියුණු කිරීමේ සමාජ නායකත්ව වැඩසටහනකි.



මෙම ව්‍යාපෘතිය මගින් එයට සහභාගි වන්නන්ට ඔවුන්ගේ ප්‍රජාවන්හි ආර්ථිකව, සමාජයීයව හා දේශපාලනිකව දායකවීමට අවශ්‍ය අධ්‍යාපනය ලබාදී ඔවුන්ගේ කුසලතා, පුද්ගල සංවර්ධන හා අන්තර්පුද්ගල සබඳතා වැඩිදියුණු කරන ලදී. ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට වැළැක්වීමේ ජාතික සැලැස්මෙහි (2016 - 2020) අන්තර්ගත 'වළක්වාගැනිමේ' හා 'මැදිහත්වීමේ' නිර්දේශ මෙම ව්‍යාපෘතියට ඇතුළත් කරන ලදී.

මෙහිදී පාර්ශවකරුවන් ප්‍රජාවන්ගෙන්, රජයෙන් (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, කාන්තා හා ළමා අංශය හා පලාත් අධ්‍යාපන අධිකාරිය), හා රාජ්‍ය නොවන සංවිධාන (සිවිල් සමාජ සංවිධාන, උපදේශකයන් හා පුහුණුකරුවන්) සහභාගි වූහ.


ආරම්භයේ සිට අවසානය දක්වා මෙම ව්‍යාපෘතිය මූලික අදියර තුනක් හරහා ක්‍රියාත්මක විය. එනම් ධාරිතාවය වර්ධනය, ප්‍රජාවන්හි සක්‍රිය දායකත්වය, අනාගත සංවර්ධනය හා මැදිහත්වීම සඳහා සබඳතාවයන් ගොඩනැගීමය.

මෙම ව්‍යපෘතිය ප්‍රධාන පළාත් 4ක ක්‍රියාත්මක විය. ඌව පළාත (මොණරාගල), දකුණු පළාත (හම්බන්තොට), උතුරු පළාත (යාපනය) හා නැගෙනහිර පළාත (මඩකළපුව). කාන්තාවන් හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ව්‍යාප්තිය හේතුවෙන් මෙම පළාත් තුළ කොට්ඨාස 6ක ප්‍රාදේශිය ප්‍රජාවන් හා ගම්මාන 20ක් තෝරාගන්නා ලදී. මොණරාගල හා හම්බන්තොට තුළ ඉහළ දරිද්‍රතාවය, සීමිත සම්පත් හා සමාජ සේවාවන් ලබා ගැනිමට නොහැකියාවක් පැවතුනු අතර ශ්‍රී ලංකාවේ වසර 30ක සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසුව යාපනය හා මඩකලපුව තුළ කාන්තාවන් හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයේ වැඩි වීමක් තිබුණි.

මෙම ව්‍යාපෘතිය මගින් පුද්ගලයින්ගේ හා ප්‍රජාවන්හි සංජානනය, අන්තර්පුද්ගල අන්තර්ක්‍රියා හා භාවිතයන් පරිවර්තනය කිරීම පිළිබඳව මූලිකව අවධානය යොමුකරන ලදී. කාන්තාවන් හා තරුණ තරුණියන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව වෙනස්කොට සැළකීම පිළිබඳව අධ්‍යයනය සඳහා ධාරිතා වර්ධන හා පුහුණු සැසි වලට සහභාගි වූහ. එහිදී ඔවුහු නායකත්ව කුසලතා ගොඩනගාගත් අතර සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති ආරම්භ කළහ. පිරිමි පුද්ගලයින් දැනුවත් කිරීමේ සැසි වලට සහභාගි වී පරිවර්තන නියෝජිතයන් බවට පත් වූහ.



ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වැළැක්වීම සඳහා වන ජාතික සැලැස්මෙහි (2016 - 2020) 'වැළැක්වීම හා සවිබල ගැන්වීම' පිළිබඳ පරිච්ඡේදය ප්‍රජාවන් ශක්තිමත් කිරීම හා ප්‍රජා නායකයින් හා ප්‍රාදේශිය මට්ටමේ සේවා සපයන්නන්ගෙන් සැදුම්ලත් සහායක කණ්ඩායම් ආරම්භ කිරීම වෙනුවෙන් පෙනී සිටියේය. මෙය සැළකිල්ලට ගනිමින් පීඩාවට පත්වූවන්ට සේවා සපයන්නන් කරා ළඟාවීමට මෙම ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික් මට්ටමේ පාර්ශවකරුවන් (වනිතා සංවර්ධන නිලධාරීන්) හා ප්‍රාදේශීය මට්ටමේ පාර්ශවකරුවන් (ග්‍රාම නිලධාරින්) සඳහා පුහුණු සැසි පැවැත්වූ බව නවෝත්පාද සමාජ සංවර්ධන පදනමෙහි අධ්‍යක්ෂකවරිය වන සමිතා සුගතිමාලා මහත්මිය සඳහන් කළාය.



"ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය වඩාත් හොඳින් අවබෝධ කරගැනීමට හා ගැටලු හමුවේ ප්‍රාදේශිය සේවා සපයන්නන් හා සම්බන්ධ වීමට ප්‍රජා මට්ටමින් කාන්තාවන් හා ගැහැණු ළමයින් ශක්තිමත් කිරීම කෙරෙහි මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අවධානය යොමු විය. ප්‍රාදේශිය මට්ටමේ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩි දියුණු කිරීම ජාතික ක්‍රියාකාරී සැලැස්මට දායක වූ ප්‍රතිචාර වඩාත් හොඳින් සම්බන්ධීකරණය සඳහා දායක විය."

**සමිතා සුගතිමාලා,**
වැඩසටහන් අධ්‍යක්ෂිකා, නවෝත්පාද සමාජ සංවර්ධන පදනම

2019 දී කොළඹ පැවති ජාතික සමුළුවේදී කාන්තා හා ළමා කටයුතු හා වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරිය වන දර්ශනා සේනානායක මහත්මිය මෙම ව්‍යාපෘතිය මගින් විවිධ අංශයන්හි සබඳතා නිර්මාණය කල ආකාරය පැසසුමට ලක් කළාය.





"මෙම ව්‍යාපෘතියේදී මෙම සියලු සංරචක සැලකිල්ලට ගෙන ඇති බව මට පේනවා. මෙම ව්‍යාපෘතියෙන් ඉගෙන ගත් දේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා තවදුරටත් දායක වනු ඇති අතර කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට විසඳුම් සෙවීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීමේ දී ඒ හා සමාන ප්‍රවේශයක් ගැනීමට කැමති අය දිරිමත් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා."

**දර්ශනා සේනානායක,**
ලේකම්,
කාන්තා හා ළමා කටයුතු හා වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය,
2019 ජාතික සමුළුව, කොළඹ

මොණරාගල, හම්බන්තොට සහ යාපනය දිස්ත්‍රික්කවල පැවති සම්මන්ත්‍රණ සඳහා පාර්ශ්වකරුවන් සහ සහභාගිවන්නන් සහභාගී වූහ. අප්‍රේල් 21 වන දින එල්ල වූ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් මඩකලපුවේ පැවැත්වීමට නියමිතව තිබූ දිස්ත්‍රික් සම්මන්ත්‍රණය අවලංගු කරන ලදී. ප්‍රාදේශීය සම්මන්ත්‍රණ මගින් වාචික සාක්ෂි, යහ භාවිතයන් සහ නිර්දේශ මාලාවක් ඉස්මතු කරන ලදී. එපමණක් නොව, එය සියලු ප්‍රජාවන්ගෙන් සහභාගී වූවන්ට සංවාදයේ යෙදීමට හා දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීමට වේදිකාවක් ලෙස ක්‍රියා කළේය.

සියලු පාර්ශවකරුවන් සහ සහභාගිවූන් 2019 ඔක්තෝබර් 2 වන දින පැවති ජාතික සමුළුවට සහභාගී වූ අතර එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016 - 2020) ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ මාලාවකින් අවසන් විය.


වාචික සාක්ෂි, සිද්ධි අධ්‍යයන සහ සජීවී විකාශනය වැනි නිර්මාණාත්මක ක්‍රම හරහා වැඩසටහනේ විශේෂ අවස්ථා ඉදිරිපත් කිරීම සඳහා ජාතික සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් ව්‍යාපෘති කාලය පුරාවට ක්‍රියාත්මක කරන ලදී.





# සක්‍රීය පුරවැසි ක්‍රමවේදය

## ඉගෙනුම් ගමන - ගඟ





'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' යන ව්‍යාපෘතිය 'ගඟ' නම් වූ ඉගෙනුම් ගමන තුළ මුල් බැස තිබුණි. මෙහිදී ඉගෙනුම් ගමන කුඩා අතු ගංගාවන්ගෙන් ආරම්භ වී ක්‍රමයෙන් විකාශනය වන ගඟකට සමාන කරයි. මෙතුළින් සහභාගීවන්නන් සංවාද ගොඩනැගීම හරහා එකට එක්ව විවිධ සංවිධාන හා ආයතන සමඟ සම්බන්ධ වී තම ප්‍රජාවන්ගේ අභිවෘද්ධිය උදෙසා සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුවේ.

සහභාගී වූවන් ඔවුන්ගේ අධ්‍යාපනය හා පෞද්ගලික සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා දින පහක කාලයක් පුරාවට වැඩමුළුවලට සහභාගී වූහ. මෙහිදී දේශීය ප්‍රජාවන් සහ සමාජ කවයන් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා සම්බන්ධ දෘෂ්ටීන්, භාවිතයන් සහ සම්මතයන් පිළිබඳ විවේචනාත්මක චින්තනයක් වැඩිදියුණු කිරීමට හිතකර සහ සහයෝගී අවකාශයන් සම්බන්ධීකාරකවරුන් සහ පුහුණු-කරුවන් විසින් නිර්මාණය කරන ලදී.





මෙහිදී පහසුකාරකයින් බ්‍රිතාන්‍ය කවුන්සිලයේ 'සක්‍රිය පුරවැසි මෙවලම් කට්ටලය' (Active Citizens Toolkit) මත පදනම්ව, දේශන වඩාත් හොඳින් ගවේෂණය සඳහා 'ෆිශ් බෝල් (Fish Bowl Technique)' ක්‍රමවේදය සහ ප්‍රජාවන්හි ධනාත්මක හා සෘණාත්මක කොටස් හඳුනා ගැනීම සඳහා 'ප්‍රජාවන් සිතියම්ගත කිරීම' වැනි අභ්‍යාස භාවිතා කළහ.






කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය සඳහා මැදිහත් වීමක් ලෙස සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති පිහිටුවීමෙන් මෙම ඉගෙනුම් ගමන අවසන් විය. මෙහිදී සහභාගි වූවන් ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රජාවන්ගෙන්, සංවිධානයන්ගෙන් සහ ආයතනයන්ගෙන් පාර්ශවකරුවන් බඳවා ගැනීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීමේ ආකෘතියක් ඉදිරිපත් කළහ.



**චාරෝ ලනාවෝ,**
සක්‍රීය පුරවැසි ප්‍රධාන පුහුණුකාරිනී (එක්සත් රාජධානිය) සහ සමාජ නායකත්ව පුහුණුකාරිනී

"මාස දහඅටකට පෙර ශ්‍රී ලංකාවේ සක්‍රීය පුරවැසි පුහුණුවක් ලබා දෙන ලෙස මට ඉල්ලීමක් ලැබුණා. එය සුවිශේෂී ඉල්ලීමක් වූයේ සමාජ නායකත්ව වැඩසටහනක් වන සක්‍රීය පුරවැසියන්ගේ ක්‍රමවේදය (Active Citizens Methodology) කාන්තාවන්ට හා ගැහැනු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව වූ නිසයි. දිස්ත්‍රික්ක හතරක පුහුණුව ලබා දීම අරමුණ වූ නිසා එය ඉතා අභියෝගාත්මක වුණා. 2018 ජූලි මාසයේදී මම පහසුකාරකයන් තිහක් සඳහා පුහුණුව ලබා දුන් කණ්ඩායමේ කොටස් කාරියක් වුණා.

මාස දහ අටකට පසුව පැවති ජාතික සමුළුවේදී දිස්ත්‍රික්ක හතරෙන් සහභාගී වූවන් තම ව්‍යාපෘති ඉදිරිපත් කළා. අප සියලු දෙනාටම 'වෙනසක්' විය හැක්කේ කෙසේද යන්න මත මෙම ව්‍යාපෘතීන් එකිනෙකට සම්බන්ධ වී තිබුණා. මෙම රැස්වීමේදී අපගේ ගමන, පහසුකම් සැපයීම සහ ක්‍රමවේදය පිළිබඳව අපි ආවර්ජනය කළා.

බ්‍රිතාන්‍ය කවුන්සිලය සහ එහි හවුල්කරුවන් මෙවන් සුවිශේෂී තේමාවක් යටතේ එක්ව ක්‍රියා කල ආකාරය ලෝකයේ අනෙකුත් කලාප සමඟ බෙදාහදා ගැනීමට මා ඔවුන්ව දිරිමත් කරනවා. මෙම වැඩසටහන අපට මතක් කර දුන්නේ මෙය ගැහැනු ළමයින් හා කාන්තාවන් ගැන පමණක් නොවන බවයි; මෙය සමස්ත සමාජයට ම අදාළ දෙයක්."



# ප්‍රධාන ක්‍රියාකාරීන්

## හවුල්කරුවන්

'කාන්තාවන්ට හා ගැහැනු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' යන වැඩසටහන මගින් ප්‍රජාවන්ට ළඟා වීම සඳහා ප්‍රාදේශීය හවුල්කරුවන්ගේ එකමුතුවක් ගොඩනගන ලදී. හවුල්කරුවන් සිවිල් සමාජ සංවිධාන, අධ්‍යාපන ආයතන සහ තරුණ සංවිධානයන්ගෙන් සමන්විත විය. මොවුන් සියලු දෙනා කාන්තාවන් හා ගැහැනු ළමයින් අරමුණු කරගත් හිංසනයට එරෙහි සටනේ තිරසාර ප්‍රතිඵල සඳහා වූ කැපවී සිටියහ.

### නවෝත්පාද සමාජ සංවර්ධන පදනම

නවෝත්පාද සමාජ සංවර්ධන පදනම සාධාරණය හා සමානාත්මතාව සහිත සිවිල් සමාජයක් නිර්මාණය කරන ක්‍රමවේදයන් නිර්මාණය කිරීම තුළින් තිරසාර සමාජ සංවර්ධනය සඳහා පාර්ශවකරුවන්ට නව්‍ය විසඳුම් සපයයි. නවෝත්පාද සමාජ සංවර්ධන පදනම සුවිශේෂී වන්නේ ළමා අයිතිවාසිකම් ආරක්ෂණ හා ප්‍රවර්ධන වැඩසටහන, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සංවර්ධන වැඩසටහන සහ මධ්‍යසාර, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන හේතුවෙනි .



"මේ වැඩසටහනේ සාර්ථකත්වය ගොඩනැගී ඇත්තේ එහි මූලික පදනම වන ප්‍රජාවන් තුළ කාන්තාවන්ට, පුරුෂයින්ට හා තරුණ තරුණියන්ට ව්‍යාපෘතියේ හිමිකාරිත්වය පවරා දීම මතය. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනයට එරෙහිව ව්‍යාපෘති රාශියක් ප්‍රජාවන් විසින් ක්‍රියාත්මක කළා. ව්‍යාපෘති ස්ථානවල පවත්නා සහයෝගී සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රජා පාර්ශවකරුවන් සමඟ නව හවුල්කාරිත්වයන් ඇති කිරීමට බ්‍රිතාන්‍ය කවුන්සිලය නවෝත්පාද සමාජ සංවර්ධන පදනමට සහාය වුණා."

**සමිතා සුගතිමාලා**
අධ්‍යක්ෂිකා, නවෝත්පාද සමාජ සංවර්ධන පදනම

### ජනතාක්ෂන් සංවිධානය

ජනතාක්ෂන් (Janathakshan) යනු ලාභ නොලබන සංවිධානයක් වන අතර එය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට තිරසාර හා හරිත විසඳුම් සපයයි. ජනතාක්ෂන් අධ්‍යාපන හුවමාරු දිරිගන්වන අතර අනාගත වෘත්තිකයන්, සංවර්ධන ආයතන, පර්යේෂකයින්, සිසුන්, විද්වතුන් සහ තීරණ ගන්නන් වෙත විශේෂඥ තොරතුරු ලබා දීමට සහාය වේ.

"වනිතා සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් සහ ආර්ථික සංවර්ධන නිලධාරීන් වැනි කාන්තා නායිකාවන් විසිහතර දෙනෙක් දින පහක් පුරා පුහුණුව සඳහා සහභාගී වුණා. එහිදී, ඔවුන් ගැටලුවේ බරපතලකම ගැන ඉගෙන ගත්තා. ඒ වගේම කාන්තාවන් හා ගැහැනු ළමයින් අරමුණු කරගත් හිංසනයට එරෙහිව හඬ ගැනීමට ඔවුන් සතු කාර්යභාරය සහ වගකීම තේරුම් ගත්තා. පුහුණු වැඩසටහන අවසානයේදී, සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති, ප්‍රජා සංවර්ධන ක්‍රියාවන් සඳහා ප්‍රාදේශීය පාර්ශවකරුවන් සහ ප්‍රාදේශීය ප්‍රජා සාමාජිකයින් දිරිමත් කළා."



**ජනක හේමතිලක,**
නියෝජ්‍ය අධ්‍යක්ෂක, ජනතාක්ෂන් සංවිධානය (Janathakshan)

**යාපන සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය**

යාපන සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය යනු යාපනය අර්ධද්වීපය, කිලිනොච්චි, මන්නාරම, වවුනියා, මුලතිව් සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක පුරා සේවාවන් සපයන ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානයකි. යාපනය සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය විසින් ආපදා සහ කම්පන පීඩා අවම කිරීම සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කරන ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. යාපන සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය විශේෂයෙන් ළමයින්ගේ හා කාන්තාවන්ගේ ආරක්ෂාව සඳහා ක්‍රියා කරයි.




"යාපන සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය සතුව සක්‍රිය පුරවැසියන්ගේ ක්‍රමවේදය (Active Citizens Methodology) ක්‍රියාවට නැංවීමේදී සාර්ථක වූ අවස්ථා බොහොමයක් තියෙනවා. ඔවුන්ගේ ප්‍රජාවන් තුළ කාන්තාවන් හා ගැහැනු ළමයින් අරමුණු කරගත් හිංසනයට එරෙහිව හඬ නැගීමට ප්‍රජාවන්හි විශේෂයෙන් කාන්තාවන් හා තරුණ තරුණියන් සවිබල ගැන්වීමට එය ප්‍රයෝජනවත් වුණා. ප්‍රජා සාමාජිකයින්ගේ ධාරිතාවය වැඩි දියුණු කර ඔවුන්ට අවස්ථා ලබා දී ඔවුන්ගේ සබඳතා වැඩිදියුණු කර අඛණ්ඩව සහයෝගය ලබා දුන්නා.

ව්‍යාපෘතියේ පසුකාලීන අවධියේදී අපි යාපනය විශ්ව විද්‍යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කර සම්මන්ත්‍රණයක් පැවැත්වුවා. එය සාර්ථක වුණේ ප්‍රජාව සමඟ ඔවුන්ගේ අත්දැකීම් බෙදාහදා ගැනීම සඳහා විවිධ වෘත්තිකයන් එක් වේදිකාවක් මතට ගෙන ඒම හේතුවෙනි. මෙයට සහභාගි වූ විශ්ව විද්‍යාල සිසුන් ද ඔවුන්ගේ අදහස් බෙදාහදා ගත් අතර අපගේ ඉදිරි වැඩ වලදී සම්බන්ධ වීමට ඔවුන් කැමැත්ත පල කළා."

**නඩරාජා සුකීර්තරාජ්**,
සම්බන්ධීකාරක, යාපනය සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය

**හැෂ්ටැග් පරපුර**

හැෂ්ටැග් පරපුර (Hashtag Generation) යනු සමාජීයව ක්‍රියාශීලී, තරුණ ශ්‍රී ලාංකිකයන් විසින් මෙහෙයවනු ලබන ලාභ නොලබන සංවිධානයකි. ඔවුන් තරුණ තරුණියන්ගේ හා විශේෂයෙන් සිය ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය සහ ලිංගිකත්වය හේතුවෙන් කොන් වී ඇති පුද්ගලයින් ගේ ප්‍රජා හා දේශපාලන සහභාගීත්වය කෙරෙහි උනන්දුවක් දක්වයි. 2015 දී ආරම්භ කරන ලද මෙම සංවිධානය දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා සහභාගීත්වය දිරිගැන්වීම සඳහා '#WeGovernSL' සහ ශ්‍රී ලංකාවේ සමරිසි පුද්ගලයන්ට හා තරුණ තරුණියන් සඳහා 'සයිබර් ආරක්ෂාව සහ උපදේශන පුහුණුව' වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණය හා සමාජ මාධ්‍ය භාවිතා කරයි.

"මෙම ව්‍යාපෘතියේදී හැෂ්ටැග් පරපුරේ (Hashtag Generation) කාර්යභාරය දෙයාකාරයකින් සිදු වුණා. සමස්ත ව්‍යාපෘතිය සඳහා සන්නිවේදන ව්‍යාපාරය අපි විසින් මෙහෙයවනු ලැබුවා. සාමාන්‍යයෙන් අපට අසන්නට ලැබෙන්නේ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ විශේෂඥ අදහස්. අපගේ ප්‍රචාරණ ව්‍යාපාරයට විවිධ දිස්ත්‍රික්කවල කාන්තාවන්, පිරිමින් සහ තරුණ තරුණියන්ගේ අදහස් ඇතුළත් වුණා. ඔවුන්ගෙන් සමහරෙකුට මෙම ගැටලුව සජීවී යථාර්ථයක්. අපි මඩකලපුවේ තරුණ තරුණියන් සඳහා පුහුණුවීම් පැවැත්වුවා. ව්‍යාපෘති චක්‍රය පුරා, විශේෂයෙන් ඔවුන්ගේ සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙම ගැටලු පිළිබඳ ඔවුන්ගේ ආකල්ප ක්‍රමයෙන් වෙනස් වන බව අපට දැකගත හැකි වුණා. මෙම ව්‍යාපෘතියෙන් අප ඉගෙන ගත් දේ අපගේ ප්‍රචාරණ ව්‍යාපාර සැලසුම් කරන ආකාරය සහ තරුණ තරුණියන් බලමුලු ගැන්වීමේ ආකාරය වැඩි දියුණු කිරීමට උදවු වුණා."

*(වමේ සිට දකුණට)*

**මහීෂා බල්රාජ්**,
**සෙනෙල් වන්නිආරච්චි**,
සම-ආරම්භකයින් සහ අධ්‍යක්ෂවරුන්

**සහානි දික්කුඹුර**,
ස්වේච්ඡා ව්‍යාපෘති සම්බන්ධීකාරක

හැෂ්ටැග් පරපුර
(Hashtag Generation)



## සම්බන්ධීකාරකයන් / සුසාධ්‍යකාරකයන් - පුහුණුකරුවන්

වැඩසටහනේ හවුල්කරුවන් විසින් සම්බන්ධීකාරකයන් සහ සුසාධ්‍යකාරකයන් - පුහුණුකරුවන් තෝරාගෙන ඔවුන් පුහුණු කරන ලදී. ඔවුන් විෂයට ඇති සම්බන්ධය, ප්‍රජාවන් පිළිබඳ දැනුම, අන්තර් පුද්ගල සම්බන්ධතා හා සන්නිවේදන කුසලතා, වැඩසටහන සාර්ථකත්ව දියත්කිරීමට උපකාරී විය. ඔවුහු වැඩමුළු සඳහා පහසුකම් සැපයීමෙන් හා සංවාදයන් අතිකිරීම මගින් සහභාගි වූවන්ට ව්‍යාපෘතියේ අරමුණු පෙන්වාදුන් අතර සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති සඳහා උපදෙස් සැපයූහ.



## රාජ්‍ය හා ප්‍රජා පාර්ශවකරුවන්

ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් කාන්තා හා ළමා සංවර්ධන ඒකකයක් පිහිටුවා තිබේ. එහි කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය හා සම්බන්ධ ගැටලු වලට ආරක්ෂාව, මානසික සහයෝගය සහ උපදේශනය වැනි සේවාවන් සැපයීම සඳහා නිලධාරීන් සිටී. මිතුරු පියස වැනි රාජ්‍ය ආයතන සහ ප්‍රජා සේවා සංවිධාන සමඟද ඒවා සම්බන්ධ වේ.



"කලාපයේ බොහෝ රටවල් ගැහැණු ළමයින් සඳහා අධ්‍යාපන ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව කෙරෙහි අවධානය යොමු කරන අවස්ථාවක, ශ්‍රී ලංකාව තුළ පිරිමි ළමයින්ට වඩා හොඳින් ගැහැණු ළමයින් අධ්‍යාපනය ලබන වෙනස්ම තත්වයක් පවතී. ගැහැණු ළමයින්ට අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට සෑහීමකට පත්විය හැකි අතර, පිරිමි ළමයින් අධ්‍යාපනයෙන් ඉවත් වීමට හේතු වන සාධක පිළිබඳව අවධානය යොමු කළ යුතුයි."

**උදයානි නවරත්නම්**,
වනිතා සංවර්ධන නිලධාරිනී,
යාපනය



**එන්. දමයන්ති**,
වනිතා සංවර්ධන පදනම,
කටුවන, හම්බන්තොට

"මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කුඩා ප්‍රජාවන් තුළ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සිදු වෙනවා. මෙම සැසිවලදී, මම නැවත ප්‍රජාවට ගිය පසු නිරත වියයුතු සියලු යුතුකම් සහ වගකීම් පිළිබඳව සටහන් තබාගත්තා. ව්‍යාපෘතියක් සාර්ථකව කරගෙන යාම සඳහා මම අමතර තොරතුරු ලබා ගත්තා. මම සවිබල ගැන්වුණු, හැකියාවෙන් යුතු කාන්තාවක් බව මම දැන ගත්තා. මෙම වැඩසටහන තුළින් මට ප්‍රගතියක් ලැබී ඇති අතර තවත් බොහෝ දේ අත්කර ගැනීමට ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා."

## සම්පත් දායකයන්

ස්ත්‍රී පුරුෂ සමාජභාවය, නෛතික සහාය සහ මානසික සෞඛ්‍යය වැනි ක්ෂේත්‍ර පිළිබඳ විශේෂිත සැසි පැවැත්වීම සඳහා මෙම වැඩසටහන විසින් සම්පත්දායකයින් තෝරා ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සහභාගිවන්නන්ට ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රජාවන් තුළ කාන්තාවන් හා ගැහැණු ළමයින් අරමුණු කරගත් හිංසනයට එරෙහිව සටන් කිරීම සඳහා විශේෂඥයින්ගේ සහාය ලැබිණි.

"ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිටුපස ඇති නීතිමය සන්දර්භය ඉගෙනීමේ වැදගත්කම හා ප්‍රයෝජනය පිළිබඳව සහභාගිවූවන් අතර ඉතා ධනාත්මක ආකල්ප අති බව මම නිරීක්ෂණය කළා. සහභාගී වූවන්ගෙන් බොහෝ දෙනෙක් කියා සිටියේ මෙම මාතෘකා ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයට සහ ඔවුන්ගේ ප්‍රජා ක්‍රියාකාරකම් වලට ප්‍රයෝජනවත් වූ බවයි. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය හා සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආයතනික හා කාර්යපටිපාටික යාන්ත්‍රණයන් පිළිබඳව සැපයූ සවිස්තරාත්මක තොරතුරු සහභාගිවන්නන් බෙහෙවින් අගය කළා. නීති ආධාර සහ වෙනත් සේවාවන් පිළිබඳ තොරතුරු වලටත් ඔවුන් හොඳ ප්‍රතිචාර දැක්වූවා."



**සජීවනී අබේකෝන්**,
නීති නිලධාරිනී, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

## සහභාගිවූවන්

'කාන්තාවන් හා ගැහැනු ළමයින් අරමුණු කරගත් හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හමුවේ කාන්තාවන්ගේ හා තරුණ තරුණියන්ගේ අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කරන ව්‍යාපෘතියකි. තෝරාගත් කාන්තාවන් ඒ වන විටත් ඔවුන්ගේ ප්‍රජාවන්හි නායිකාවන් වූ අතර, තරුණ තරුණියන් ඔවුන්ගේ අධ්‍යාපන හා විෂය බාහිර ක්‍රියාකාරකම්වල හොඳින් නිරත වන්නන් වූහ.

මෙම පුහුණුව ඔවුන්ගේ ආකල්පමය හා චර්යාත්මක වෙනස කෙරෙහි අවධානය යොමු කළ අතර එමගින් ඔවුන්ට තම ප්‍රජාවන්හි නායකයින් වීමටත් ඊළඟ පරම්පරාවට ආදර්ශයක් වීමටත් හැකි විය. සහභාගිවන්නන් ඉගෙනීමේ ගමනක යෙදුනු අතර එය සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති වලින් අවසන් විය. මෙහිදී ඔවුන් තම ප්‍රජාව තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීමට සමත් වූ අතර සබඳතා ගොඩනඟා කාන්තාවන් හා ගැහැණු ළමයින් අරමුණු කරගත් හිංසනයට එරෙහි ජාතික ව්‍යාපාරයට සම්බන්ධ විය.

"කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳ සක්‍රීය පුරවැසි පුහුණු වැඩසටහනෙන් පසුව, ප්‍රදේශයේ සෙසු තරුණ තරුණියන් සමඟ අපි කුඩා උපදේශනයක් පැවැත්වූවා. අපේ ගමේ මත්ද්‍රව්‍ය සහ ළමා විවාහ පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අපි තීරණය කළා. අපි වැඩසටහනෙන් සංවාද රංග මණ්ඩප ගැන ඉගෙන ගත්තා. මට නාට්‍ය කෙරෙහි දැඩි ඇල්මක් ඇති අතර මෙම ගැටලුව විසඳීම සඳහා මම සංවාද රංග මණ්ඩප නිෂ්පාදනයක් කරමු යැයි යෝජනා කළා. තරුණියක් ලෙස අපගේ ප්‍රජාව තුළ එවැනි ව්‍යාපෘතියක් මෙහෙයවීම මට අභියෝගයක් වුණා. එහෙත්, මගේ ජීවිතය සහ ප්‍රජාවේ අනෙකුත් ගැහැනු ළමයින්ගේ ජීවිත යහපත් කර ගැනීමට අවශ්‍ය විශ්වාසය සහ මෙවලම් මෙම වැඩසටහන මට ලබා දුන්නා."



**තද්ෂයිනි**,
සක්‍රීය පුරවැසි, සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති නායිකා,
මඩකලපුව

# කාන්තා හඬ

"මම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වු හිංසනයට මුහුණ දුන්නා, විශේෂයෙන් මගේ විවාහ ජීවිතයේ මුල් දවස්වල." යයි පෙර පාසල් ගුරුවරියක් හා බුත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වගුරුවෙල කාන්තා සංවිධානයේ ප්‍රධානිය වන කේ. එම්. රත්නාවතී පැවසුවාය.

ඇයගේ ප්‍රජාව තුළ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය සම්බන්ධ සිදුවීම් ඇය දැක තිබේ. ඇය විශ්වාස කරන පරිදි අනෙකුත් කාන්තාවන් අත්විදින මෙම හිංසනය හට ගන්නේ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම සහ ප්‍රදේශයේ කාන්තාවන් සඳහා ඇති සීමිත අධ්‍යාපන අවස්ථා හේතුවෙනි.

"අපි ඇති කළේ තමන්ගේ අදහස් ප්‍රකාශ කළ හැකි පරම්පරාවක්" යයි රත්නාවතී තවදුරටත් පැවසුවාය. ඇගේ ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අදහස් වෙනස් කිරීමට ඇගේ ව්‍යාපෘතිය ඉවහල් වූ බව ඇය කියා සිටියාය.





**කේ. එම්. රත්නාවතී,**
සක්‍රිය පුරවැසි,
බුත්තල, මොණරාගල

මෙම වැඩසටහනට සහභාගී වීමෙන් ඇය ලබා ගත් කුසලතා යොදා ගනිමින් විවිධ අවස්ථාවන්හිදී ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීමට ඇයට හැකි විය. ඇය තමා උගත් පාඩම් වල උපකාරයෙන් තම ප්‍රජාවට තොරතුරු සහ සම්පත් ලබා ගැනීමට උපකාර කිරීම සඳහා 'සතුටින් පිරි සමාජයක් කරා' නමින් සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතියක් ආරම්භ කළාය.

"කාන්තාවන් සහ පිරිමින් අසමාන නැහැ. ඔවුන් ඇත්ත වශයෙන්ම සමානයි. ගමේ අය මේ ගැන තේරුම් අරගෙන තියෙනවා. අපගේ ක්‍රියාකාරකම් වලට සහභාගී වූ අය මෙම අදහස් ඔවුන් දන්නා අනෙක් අයට සන්නිවේදනය කළා. මේ තුළින් සමානාත්මතාවය සඳහා වැඩි රුකුලක් ලැබී තියෙනවා."

ඇයගේ පළමු වැඩමුළුවට සහභාගි-වූවන් ගෘහස්ථ මුදල් කළමනාකරණය (ගෘහ අයවැයක් නිර්මාණය කිරීම, පුද්ගලික අයවැය සහ ඉතිරිකිරීම්) හා කුඩා ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳව ඉගෙන ගත්හ. එම වැඩමුළුව අවසන් වූ විගස සහභාගී වූවන් පස් දෙනෙක් ස්වයං රැකියා ව්‍යාපාර ආරම්භ කළහ.

ඉන්පසු ඇය වයස අවුරුදු 12 -18 අතර ළමුන් සඳහා මානසික සෞඛ්‍යය පිළිබඳව සැසියක් පැවැත්වූවාය. ඇය ප්‍රදේශයේ මනෝ වෛද්‍යවරයෙකුගේ සහාය ඇතිව ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා මානසික සෞඛ්‍යය පිළිබඳව ඔවුන්ව දැනුවත් කළ අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඔවුන්ගේ වැරදි වැටහීම් අභියෝග යට ලක් කළාය.

ඇගේ තුන්වන වැඩමුළුවෙදී ඇය තරුණ තරුණියන් සඳහා නායකත්ව වැඩසටහනක් පැවැත්වූවාය. මෙහිදී ගැහැණු ළමයින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය සහ ඔවුන්ගේ ජීවිතවලට ඇති අයිතිය ගැන ඉගෙන ගත්හ.

“ප්‍රජා නායිකාවක් ලෙස, මගේ ප්‍රජාවේ නොසතුටින් සිටින කාන්තාවන් මම දකිනවා. මම ඔවුන්ව මහමඟදී හමු වූ විට තැලුම් තුවාල පෙන්වමින් ඔවුන්ගේ කතාව මට හඬමින් පවසනවා. කාන්තාවන් තම පවුල් වලින් හුදෙකලා වී දුක්ඛිත ජීවිත ගත කරනවා. පැමිණිලි කළ යුත්තේ කාටද යන්න හෝ ඔවුන්ගේ තත්වය විසඳා ගන්නේ කෙසේද යන්න ඔවුන් දන්නේ නෑ.”

**ප්‍රියංකා ප්‍රියදර්ශනී,**
සක්‍රීය පුරවැසි,
වලස්මුල්ල, හම්බන්තොට



ළමා විවාහ වලස්මුල්ලෙහි බහුලව දක්නට ලැබේ. තරුණයන් බොහෝ දෙනෙක් මත්පැන් හෝ මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කිරීමට පටන් ගෙන පසුව අකාලයේ පවුල් ආරම්භ කරති. තමන්ට හෝ තම පවුලේ අයට උපකාර කිරීම සඳහා ඔවුන්ට හොඳ අධ්‍යාපනයක් හෝ ස්ථාවර රැකියාවක් නොමැත. ප්‍රචණ්ඩත්වය මෙතැනින් ආරම්භ වේ. මෙම තත්වය තුළ සිටින කාන්තාවන්ට මෙම ආතතීන් විසඳීමට හෝ සේවා සපයන්නන් වෙත ළඟා වීමට නොහැක.

‘කාන්තාවන් හා ගැහැණු ළමයින් අරමුණු කරගත් හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම’ ව්‍යාපෘතිය හරහා වලස්මුල්ලෙහි සක්‍රීය පුරවැසියෙකු වන ඇත්පිටිය කාන්තා සංවර්ධන සංගමයේ සභාපතිනිය හා මවක් වන, ප්‍රියංකාට තමාගේ සහ ප්‍රජාවේ ජීවිත වැඩිදියුණු කිරීමට අවශ්‍ය මෙවලම් ලැබුණි.

ප්‍රියංකාගේ සැමියා දුම්පානය කරන්නෙකි. මෙම ව්‍යාපෘතිය තුළින් සන්නිවේදනයේ වැදගත්කම පිළිබඳව ඇය ඉගෙන ගත්තාය. ඇය තම සැමියා හා කතා කිරීමෙන් ඔහුට දුම්පානය අඩු කිරීමට උදව් කළාය.

නිවසේදී ඵලදායී සාකච්ඡාවලින් ධෛර්යමත් වූ ඇය, තම ප්‍රජාව තුළ සිදුවන ගෘහස්ථ හිංසනය මැඩපැවැත්වීමට තීරණය කළාය. මේ සඳහා ඇය ප්‍රජා සාමාජිකයින්, අධ්‍යාපනඥයින් සහ ප්‍රාදේශීය නිලධාරීන්ගේ සහාය ලබා ගත්තාය.

ඇය ගෘහස්ථ හිංසනය අත්විඳින පවුල් කිහිපයකට සෞඛ්‍යමත් සබඳතා ගැන ඉගෙන ගැනීමට ආරාධනා කළාය.

Voices of Humans සංවිධානයේ අධ්‍යක්ෂක හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උපදේශකවරයෙක් වන කපිල රස්නායක ප්‍රජාව දැනුවත් කිරීමේ සැසියක් පැවැත්වුවේය.

මෙම සැසිවලදී, ප්‍රියංකා විසින් කාන්තාවන් හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයෙන් පීඩාවට පත්වූවන් සේවා සපයන්නන් හා සම්බන්ධ කිරීම සඳහා අත් පත්‍රිකා බෙදා දුන්නාය. එමඟින් ඔවුන්ට නිවැරදි සමාජ සේවා සහ බලධාරීන් වෙත ළඟා විය හැකි විය.

“මෙම වැඩසටහන තුළින් පවුල් කිහිපයකට ඔවුන්ගේ ගැටළු විසඳීමට සහ නැවත එක්වීමට අපි උදව් කළා. මෙම පවුල් තවමත් ඉතා සතුටින් සිටිනවා. කා සමඟ කතා කළ යුතුද, කුමන සංවිධානයෙන් උපදෙස් ලබා ගත යුතුද යන්න දැන්, ඔවුන් දන්නවා. මෙම තොරතුරු දැන ගැනීමත් සමග සහභාගී වූවන්ගෙන් සමහරක්, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට විසඳුම් ලබා ගැනීමට අදාළ බලධාරීන් සම්බන්ධ කර ගත්තා.”



මඩකලපුවේ කොක්කඩිචෝලෙයි හි තංගවේල් සත්‍යාගේ ගම්මානයේ කාන්තාවන්ට අධ්‍යාපන හා රැකියා අවස්ථා සීමිතයි. ඔවුන්ට රැකියාවක් තිබුණද රැකියා සුරක්ෂිතභාවය නොතිබිණි.

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයක් සිදු වූ විට, ප්‍රජාව එයින් පීඩාවට පත්වූ තැනැත්තියට දොස් පවරා ඇයව තවදුරටත් පීඩාවට පත් කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණයට හසු නොවී ගිලිහී ගිය අතර පීඩිතයින් දිගින් දිගටම අපයෝජන චක්‍රයක සිරවී සිටියහ.



"ප්‍රචණ්ඩත්වයට ලක්වන කාන්තාවන් සමාජය විසින් නොසලකා හරිනවා. එනිසා ඔවුන්ට ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ශක්තිමත්ව සිටීමට නොහැකියි."

**ටී. සත්‍යා,**
සක්‍රිය පුරවැසි,
කොක්කඩිචෝලෙයි, මඩකලපුව

'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' ව්‍යාපෘතියේ දී, ඇගේ කණ්ඩායම ඔවුන්ගේ ප්‍රජාවෙහි ඇති ගැටලු සමීපව විමසා බැලූ අතර විසඳුම් නිරාකරණය සඳහා 'අපේක්ෂා ගස (Tree of Expectations)' සහ 'ගැටලු ගස (Problem Tree)' වැනි ක්‍රමවේදයන් භාවිතා කළහ.



මෙම අත්දැකීම් ඇගේ අන්තර් පුද්ගල සම්බන්ධතා වැඩි දියුණු කිරීමට උපකාරී වූයේ ඇය සංවාද ආරම්භ කිරීමට, විවිධ මත සලකා බැලීමට හා ආතතීන්ට සාමකාමී විසඳුම් ලබා දීමට ඉගෙන ගත් බැවිනි. තම ප්‍රජාවේ අභිවෘද්ධිය සඳහා මෙම කුසලතා යොදා ගැනීමට ඇය තීරණය කළාය.

දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන කාන්තාවන්ට මැහුම් ශිල්පය පිළිබඳ වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා සත්‍යා විසින් සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතියක් දියත් කරන ලදී. එමගින් ඔවුන්ට ස්ථාවර ආදායමක් ලැබුණු අතර ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු විය. ඇය මේ සඳහා සමෘද්ධි සංගමය, කාන්තා සමිතිය සහ ග්‍රාම සංවර්ධන සමිතිය වැනි පාර්ශවකරුවන් කිහිප දෙනෙකුගේ සහාය ලබා ගත්තාය.

පුහුණුව අවසන් වූ පසු සහභාගි-වූවන් 20 දෙනෙක් ඇඟලුම් කම්හල්වල රැකියා සඳහා අයදුම් කළහ. මෙහිදී, ඔවුන්ට රු.16,000 ක මූලික වැටුපක් ලැබුණු අතර ඉදිරියේදී ඔවුන්ට රු. 20,000 සිට 25,000 දක්වා වැටුපක් උපයා ගැනීමට අවස්ථාව තිබේ.

සමහරුන්ට විදේශයන්හි රැකියා සොයාගැනීමට පවා අවස්ථාව ලැබුණි. 20 දෙනෙක් නිවසේ සිටම ස්වයං රැකියා ව්‍යාපාර ආරම්භ කලහ.

සහභාගී වූවන්ගේ සහ ඔවුන්ගේ ප්‍රජාව තුළ සිදුවූ පරිවර්තනය ගැන සත්‍යා ආඩම්බර වේ. ඇයගේ ව්‍යාපෘතියට සහභාගිවූවන් ඊළඟ පරම්පරාව සඳහා ශක්තිමත් ආදර්ශයක් ලෙස පෙනී සිටිති.

සහභාගිවන්නන් මෙම සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතියට ධනාත්මක ප්‍රතිචාර දැක්වූහ. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම මූල්‍ය ස්වාධීනත්වයේ හා ගෘහස්ථ ආදායමට සමානව දායක වීමේ වැදගත්කම පිළිබඳව වටහා ගත්හ. එහි ප්‍රතිඵලයක් ලෙස සත්‍යා තම ප්‍රජාවේ විවිධ දක්ෂතා ඇති පිරිස් තල් කර්මාන්තය සමග සම්බන්ධ කිරීම සඳහා සිය ව්‍යාපෘතිය පුළුල් කිරීමට තීරණය කර තිබේ.





මාවිද්දපුරම් කාන්තා ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපතිනිය වන තනබාලසිංහම් රාසමනී 'සක්‍රිය පුරවැසි' පුහුණුව සඳහා සහභාගී විය. රාසමනීගේ ගම්මානය වන මාවිද්ද-පුරම් කුඩා පරිමාණයේ ගෙවතු වගාව සඳහා ඉතා සුදුසු බිමකි. එසේ වුවත් එහි කිසිවෙක් නිරන්තරයෙන් ලැබෙන හිරු එළිය, ආර්ද්‍රතාවය සහ සාරවත් පස භාවිතයට ගෙන තිබුණේ නැත.

මාවිද්දපුරම් හි පිරිමි පුද්ගලයින් කිහිප දෙනෙක් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේදී තුවාල ලබා ආබාධිතයන් ලෙස ආපසු සිය නිවෙස් කරා පැමිණ තිබුණි. ඔවුන් සිය නිවෙස්වල මූලික උපයන්නන් වුවද තම පවුල් වෙනුවෙන් ඉපයීමට ඔවුන්ට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස පිරිමින් එතෙක් ඉටු කළ කාර්යභාරයේ අඩුව පිරවීමට කාන්තාවන්ට සිදුවූ නමුත් කාන්තාවන්ගේ අඩු අධ්‍යාපනය, සීමිත කුසලතා සහ සමාජ අපකීර්තිය ඔවුන්ට බාධක ලෙස ක්‍රියා කළේය.

"පුහුණු සැසිවලදී, මූල්‍ය ස්වාධීනත්වයේ වැදගත්කම ගැන මම ඉගෙන ගත්තා. ස්ථාවර ආදායමක් තිබේ නම් කාන්තාවන්ට නිවසේ ආදායමට දායක විය හැකි අතර එයින් මූල්‍ය හා අන්තර් පුද්ගල ආතතීන් දුරු වෙනවා."

**ටී. රාසමනී,**
සක්‍රිය පුරවැසි,
මාවිද්දපුරම්, යාපනය

ඇයගේ සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතිය සඳහා, ගෙවතු වගා වැඩසටහනක් ආරම්භ කිරීමට ඇය තීරණය කළාය. මෙම ව්‍යාපෘතියේ මැදිහත්වීමෙන් ඇය තම ප්‍රජාවේ අවතක්සේරුවට ලක්ව සිටි මව්වරුන්, භාවිතයට නොගත් සරු භූමිය හා සම්බන්ධ කළාය.

ඇය අසල පිහිටි ගොවිපලකින් ශාක, ස්වාභාවික පළිබෝධනාශක සහ ස්වාභාවික පොහොර ලබා ගත්තාය. බාහිර සම්පත්දායකයින්ගේ සහාය ඇතිව මව්වරු වගා ක්‍රම සහ කාබනික කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳව ඉගෙන ගත්හ. ඉන්පසු මෙම කණ්ඩායම බෝංචි, වම්බටු, තක්කාලි, බණ්ඩක්කා සහ වට්ටක්කා වගාවට යොමු විය.

මෙම ව්‍යාපෘතිය සහභාගිවන්නන්ගේ හැරවුම් ලක්ෂ්‍යයක් බවට පත්වූයේ ඔවුන් තම පවුල්වල 'උපයන්නන්' ලෙස සාර්ථක වූ බැවිනි.

ඔවුන් මුදල් උපයා, අනාගතය සඳහා ලාභ ඉතිරි කර, ඔවුන්ගේ පවුල්වල ජීවනෝපායන් පෝෂණය කළහ. මව්වරුන් මෙම ව්‍යාපෘතිය ප්‍රජාව සම්බන්ධ කිරීමට, සංවාද ඇති කිරීමට හා ප්‍රජාව ගොඩනැඟීමට භාවිතා කළ බැවින් එය ඔවුන්ට විවේකය සඳහා අවකාශයක් බවට පරිවර්තනය විය.

කාලයත් සමග තව දුරටත් මෙම ව්‍යාපෘතිය සමග කාන්තා පාර්ශව-කරුවන් සම්බන්ධ වූ අතර එමඟින් 'කාන්තා කණ්ඩායම්' ශක්තිමත් කර ඊළඟ පරම්පරාව සඳහා ආදර්ශමත් කාන්තාවන් බිහි කරන ලදී.

තරුණයින් වැනි අනෙකුත් පාර්ශවකරුවන් බඳවා ගැනීම සහ අඹ වැනි බෝග වගා කිරීම තුළින් තම සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතිය පුළුල් කිරීමට රාසමනී සැලසුම් කරයි.

"2005 දී ගෘහස්ථ හිංසනය පිළිබඳ නීති සම්පාදනය කර තිබුණද ගෘහස්ථ හිංසනය අඩු වෙලා නැහැ. පැහැදිවම නීතිමය ක්‍රියාමාර්ගවලින් පමණක් ගෘහස්ථ හිංසනය තුරන් කරන්න බෑ. ඒ වෙනුවට, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය නැවැත්වීම සඳහා නීතිය, රජය, සාමාන්‍ය ජනතාව සහ ස්වාධීන පුද්ගලයන් වැනි ක්ෂේත්‍ර කිහිපයක්ම සාමූහික වගකීමක් ගත යුතුයි. ප්‍රචණ්ඩත්වය බලපාන්නේ එයට ගොදුරු වන තැනැත්තියට සහ ඇගේ මානසික සෞඛ්‍යයට පමණක් යැයි වැරදි මතයක අපි ඉන්නවා. මේක ඇත්තක් නෙවෙයි. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ඇයට, ඇයගේ පවුලට, ඇයගේ ප්‍රජාවට සහ ඇයගේ රටට පවා බලපෑමක් ඇති කරනවා සාමූහිකව කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ගැන සිතන විට, අපට එය නැවැත්වීමට සහ රට තුළ ශක්තිමත් පවුල් ඇති කිරීමට අවධානය යොමු කළ හැකියි."



**නලිනි රත්නරාජා,**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා මානව හිමිකම් උපදේශිකා,

සැසි මැදිහත්කරු
(Session Moderator),
දිස්ත්‍රික් සම්මන්ත්‍රණය, යාපනය

# පිරිමි හඬ

ප්‍රචණ්ඩත්වයෙන් තොර ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා පිරිමින් සහ පිරිමි ළමයින් බඳවා ගැනීම කෙරෙහි මෙම ව්‍යාපෘතිය දැඩි අවධානයක් යොමු කළේය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳව පිරිමින් දැනුවත් කිරීමේ සැසි හරහා කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳ වැරදි වැටහීම් නැවත සලකා බැලීමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස වටහා ගැනීමට ඔවුන් දිරිමත් කරන ලදී. මෙහිදී වගකීම් සහගත පුරවැසියන් වීමට හා ප්‍රජාවන් තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා සහායකයින් සහ උපදේශකයින් ලෙස කටයුතු කිරීමට ඔවුන්ව දිරි ගන්වන ලදී.

හම්බන්තොට සහ මොණරාගල යන ප්‍රදේශවල 'සතුටු පවුල්' සහ 'ආදරණීය තාත්තා' යන වැඩසටහන් තුළින් සෞඛ්‍යසම්පන්න සබඳතා කෙරෙහි අවධානය යොමු විය. සම්පත්දායක, කපිල රස්නායක විශ්වාස කළේ, එක් එක් සාමාජිකයින්ගේ සහභාගීත්වයට වඩා පවුල් එකතුවක් හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය තුරන් කිරීම වඩා ප්‍රතිඵලදායක බවයි.

ඔහුගේ 'විනෝද කුස්සිය' සැසිය ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්මතයන්ට අභියෝග කළ අතර සහභාගිවන්නන් එයින් ගෘහස්ථ භූමිකාවන් පිළිබඳ ඔවුන්ගේ පූර්ව නිගමනවලට අභියෝග කළහ.

කපිලගේ සැසිවාරයට සහභාගී වූ ගලහිටිය නැහෙනහිරින් පැමිණි ප්‍රසාද් සමන් කුමාර මෙම සැසිය විශේෂයෙන් අගය කළේය. බිම්මල් ව්‍යංජනය පිසීමේදී සහභාගීවූවන් සහයෝගයෙන් කටයුතු කළ අතර ඔහු එය තමන්ට අමතක නොවන අත්දැකීමක් ලෙස සිහිපත් කළේය. ඔහු ආපසු නිවසට පැමිණි විට, සැසිවාරයෙන් ඉගෙන කරගත් පාඩම් අන් අය සමග බෙදා ගත්තේය.



"අපි පවුල් සමඟ සම්බන්ධ වුණේ පවුල් වලට ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීම සඳහා සම්මතයන් ස්ථාපිත කළ හැකි නිසායි. මෙම වැඩසටහන තුළින් බොහෝ මිනිසුන්ගේ මානසිකත්වය වෙනස් කිරීමට අපිට හැකි වුණා. පියවරුන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වුනු හිංසනය ට එරෙහිව නැගී සිටීමට, යල්පැන ගිය මතයන්ගෙන් මිදීමට, නව අදහස් වැළඳ ගැනීමට හා මෙම ප්‍රජා ගැටලුවට විසඳුම් සෙවීමට දිරි ගැන්වීමට අපි සමත් වුණා."

**කපිල රස්නායක**,
ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ උපදේශක සහ
Voices of Humans සංවිධානයේ නිර්මාතෘ



"මම මේ ආකාරයේ වැඩසටහනකට සහභාගි වූ පළමු අවස්ථාවයි. එය විනෝදාත්මකයි. වොලිබෝල් තරඟයක්, ඉවුම් පිහුම් තරඟයක් සහ සංගීත වැඩසටහනක් තිබුණා. අපි ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය නම් පොදු ගැටලුව හඳුනාගැනීමට හා එයට ප්‍රතිචාර දැක්වීමට ගත යුත් පියවර ගැන කතා කළා. නැවත මගේ ප්‍රජාවට පැමිණි දා සිට, මම වඩාත් නිරීක්ෂණයෙන්, අවබෝධයෙන් හා ප්‍රතිචාරාත්මකව ඉන්නවා. මම ඉගෙනගත් දේ මගේ පවුලේ අය හා මිතුරන් සමඟ බෙදා ගත්තා."

**ප්‍රසාද් සමන් කුමාර**,
ගලහිටිය නැගෙනහිර, වලස්මුල්ල

“කාන්තා පිරිමි දෙපාර්ශවයම සමාජයේ අයුක්තියට හා ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන අයුරු මම දැක තියෙනවා” යැයි වැඩසටහනට සහභාගි වූ ගබඩා භාරකරුවෙක් වන ඩී. එම්. උපුල්ශාන්ත දිසානායක පැවසුවේය.

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය තුරන් කිරීම සඳහා අඛණ්ඩ සහයෝගය සහ උපදේශනය සැපයිය යුතු බව ඔහු වගුරුවෙල පැවති පිරිමින් දැනුවත් කිරීමේ සැසිය හරහා ඉගෙන ගත්තේය. “මම සමාජය වෙනස් කිරීමට උපකාරී වන ක්‍රමවේදයන්ද ඉගෙන ගෙන තියෙනවා. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය සිදුවුවහොත් මට එය විසඳීමට අවශ්‍ය විශ්වාසය හා දැනුමක් තියෙනවා” යයි ඔහු පැවසුවේය.



**ඩබ්ලිව්. එම්. උදාන මධුමාල්,**
බුත්තල, මොණරාගල

සක්‍රීය පුරවැසියන්ගේ ඉගෙනුම් ගමන වන ‘ගඟ’ මගින් ආභාෂය ලැබූ උපුල්ශාන්ත විශ්වාස කරන්නේ, සමාජ වෙනස ආරම්භ කළ යුත්තේ තමාගේ සිතුවිලි සහ ක්‍රියාවන් තුළින් බවයි. ඉන්පසුව ඔහු තම විශ්වාසයන් හා අත්දැකීම් තම දෙමාපියන් හා පවුලේ අයට සන්නිවේදනය කිරීමට බලාපොරොත්තු වේ. ඉන්පසුව ඔහු මෙම පාඩම් තම මිතුරන්, වැඩිහිටියන් සහ ප්‍රජා සාමාජිකයින් සමග බෙදා ගැනීමට අදහස් කරයි. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳව තම ප්‍රජාව දැනුවත් කිරීමෙන් වඩා හොඳ ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට හැකි වනු ඇතැයි ඔහු විශ්වාස කරයි.

“ප්‍රචණ්ඩත්වයට යොමු වෙන්න එපා යයි මම කෙනෙකුට උපදෙස් දෙන විට, ඔහු එය සැබවින්ම තේරුම් ගන්නේ නැහැ, නමුත් ඔහුට ඒ පිළිබඳව සමූහයක් තුළ උගන්වනු ලැබුවහොත්, ඔහු එම අත්දැකීමෙන් වැඩි යමක් ඉගෙනගන්නවා. මෙම වැඩසටහන මගින් ආරම්භ කරන ලද සාමූහික සංවා-දවලට මම විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා.”



“අපට ප්‍රචණ්ඩත්වය හා සමාජ බාධක පිළිබඳව ඇති ගැටලු විසඳා එම ගැටලු මිනිසුන්ගේ ජීවිත වලින් හා මනසින් ඉවත් කරන්න පුලුවන්. මම විශ්වාස කරන පරිදි වෙනසක් ආරම්භ කිරීමට හොඳම ස්ථානය තමාමයි.”

**ඩී. එම්. උපුල් ශාන්ත දිසානායක,**
මොණරාගල

“මිනිසුන් පුනරුත්ථාපනය අවසන්ව ආපසු පැමිණීමත් සමග අපගේ ධීවර ප්‍රජාව අභියෝග කිහිපයකට මුහුණ පා තියෙනවා” යයි යාපනයේ තෙලිප්පලෙයිහි නල්ලිනාකපුරම් ගම්මානයේ සභාපති වන මුත්තුරාජා ඉන්පරාසා පැවසුවේය .

ඉන්පරාසා විශ්වාස විශ්වාස කරන්නේ තම ප්‍රජාවේ පිරිමින් විරුද්ධ ලිංගිකයන් පිළිබඳව ඔවුන්ගේ මතයන් සහ ඔවුන්ට සළකන අකාරය වෙනස් කළ යුතු බවයි. සෑම වයස් කාණ්ඩයකම කාන්තාවන් මහමඟදී ලිංගික හිරිහැර වලට, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය නිසා සිදුවන හිංසනයට සහ සයිබර් හිංසනය වැනි ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙති.

ඔහු සහභාගිවුණ නල්ලිනාකපුරම්හි පැවති ‘පිරිමින් දැනුවත් කිරීමේ සැසිය’ සෞඛ්‍යසම්පන්න සබඳතා පවත්වා ගැනීමට පවුල් දිරිමත් කළේය.



“ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ආමන්ත්‍රණය කිරීමට මෙම වැඩසටහන මට උපකාර වුණා. එය මගේ පවුලෙන් ආරම්භ කර මෙම පණිවිඩය ක්‍රමයෙන් මුළු ගමටම පතුරුවන්න මට පුලුවන් වුණා. දැන් ප්‍රජාවේ පවුල් යහපත් සබඳතාවල වැදගත්කම තේරුම් ගෙන ඇති අතර ඔවුන්ගේ පවුල්වල ආතතීන් හා ප්‍රචණ්ඩත්වය පාලනය කිරීමට අවශ්‍ය මෙවලම් ඔවුන් සතුව තියෙනවා.”

**එම්. ඉන්පරාසා,**
නල්ලිනාකපුරම්,
තෙලිප්පලෙයි, යාපනය

# තරුණ හඬ



ලක්ෂිකා පියුමාලි ඇගේ ගම්මානය වන මොණරාගල දික්යායෙහි සයිබර් හිංසනය හා සම්බන්ධ සියදිවි නසාගැනීම්වල වැඩිවීමක් නිරීක්ෂණය කළාය. ඇගේ ප්‍රජාවේ තරුණ තරුණියන් බොහෝ දෙනෙක් සමාජ මාධ්‍ය සහ අන්තර්ජාලය භාවිතා කළහ.

'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' ව්‍යාපෘතිය තුළින් කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට සයිබර් හිංසනය ද ඇතුළත් බව ඇය දැන ගත්තාය. 'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි අන්තර්ජාල (සමාජමාධ්‍ය) හිංසනයට එරෙහිව සටන් කිරීම' යන සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතිය හරහා තම ප්‍රජාවේ තරුණ හා වැඩිහිටි සාමාජිකයින් දැනුවත් කිරීමට ඇය තීරණය කළාය. ඇය පාර්ශවකරුවන් කිහිප දෙනෙකුගේ සහාය ලබා ගෙන පෝස්ටර් ව්‍යාපාරයක් දියත් කළාය. මෙම ක්‍රියාවන්ගෙන් යහපත් ප්‍රතිඵල ලැබුණු අතර ප්‍රචණ්ඩත්වය අන්තර්ජාලය හරහා සිදු වුවද එය එදිනෙදා ජීවිතයට පැහැදිලිව බලපෑම් ඇති කරන බව ඉගෙන ගැනීමට ප්‍රජාවට සහාය විය.

ලක්ෂිකා කොළඹ පැවති ජාතික සමුළුවේදී තමා ඉගෙන ගත් දේ සහ ඇය ලැබූ අත්දැකීම් ඉදිරිපත් කළාය. මෙහිදී සාමූහික ප්‍රාදේශීය ක්‍රියාකාරකම් ජාතික අභිවෘද්ධිය සඳහා ඉවහල් වන බව ඇය දැන සිටියාය.



"ග්‍රාමීය ප්‍රදේශයක ගැහැණු ළමයෙක් ලෙස කොළඹ ජාතික සමුළුවේදී මගේ ප්‍රජාව නියෝජනය කරමින් විශාල පිරිසක් ඉදිරියේ කතා කිරීමට ලැබීම මට මහත් ආඩම්බරයක්. 'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි අන්තර්ජාල හිංසනයට එරෙහිව සටන් කිරීම' යන අපගේ සමාජමාධ්‍ය ව්‍යාපාරයේ දැනුවත්භාවය පුළුල් කිරීමට හා සමාජ ක්‍රියාකාරකම් සිදු කිරීම අපි දික්යායෙහි තරුණ තරුණියන් බලමුලු ගන්වනවා. ප්‍රචණ්ඩත්වයෙන් තොර සමාජයක් ඇති කිරීමට හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා ප්‍රජා මට්ටමින් ගනු ලබන පියවරවල වැදගත්කම මම තේරුම් ගත්තා."

**ලක්ෂිකා පියුමාලි,**
සක්‍රීය පුරවැසි (දික්යාය)
2019 ජාතික සමුළුව, කොළඹ



"කාන්තා මූලික පවුලකින් පැවත එන මම, මුහුණ දුන් අභියෝගවලදී මම තනි වුණායයි වැරදි වැටහීමකයි හිටියේ. යාපනයේ දිස්ත්‍රික් සම්මන්ත්‍රණයේදී තරුණ සංසදයකදී මට බොහෝ ගැහැණු ළමයින් සහ තනිකඩ මව්වරුන් මුණගැසුණු විට මගේ එම මතය වෙනස් වුණා. කාන්තාවන්ගේ දෛනික අරගලයන් සහ හද කම්පා කරවන කතා මට අහන්නට ලැබුණා. හඬක් නැති කාන්තාවන් සඳහා හඬ නැගීමට මම අධිෂ්ඨාන කරගෙන ඉන්නවා. යාපනය විශ්ව විද්‍යාලයේ මා සහ මගේ මිතුරන් විසින් ආරම්භ කරන ලද පුණ්‍යායතනයක් වන 'මනිදම්' හරහා මම ඔවුන්ව සවිබල ගන්වනවා."

**නිවේතා සිවරාජා,**
සක්‍රීය පුරවැසි, යාපනය විශ්ව විද්‍යාලය,
තරුණ සංසදය - යාපනය සම්මන්ත්‍රණය 2019



ප්‍රදීප් ප්‍රසන්න ඔහුගේ ගම්මානය වන මොණරාගල කෙසෙල්වත්තෙහි, පවුල් ගැටලු, දික්කසාද සහ මත්ද්‍රව්‍ය අනිසි භාවිතය පිළිබඳව නිරීක්ෂණය කර තිබුණද කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය සමග ඒවායේ සම්බන්ධතාවය පිළිබඳව ඔහුට තිබුනේ සීමිත අවබෝධයකි. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ඔහුගේ ගමේ සංවාදයට ලක් වූ මාතෘකාවක් නොවේ. ඔහු 'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයනට ආමන්ත්‍රණය සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීමේ' ව්‍යාපෘතියට සම්බන්ධ වූ විට ඒ සියල්ලේ අන්තර් සම්බන්ධතා තේරුම් ගත්තේය. දින 4 ක් පුරාවට ඔහු ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට හේතු වන විවිධ සාධක සහ එහි විවිධ ස්වරූපයන් ගැන ඉගෙන ගත්තේය.

'සතුටු පවුල්' ව්‍යාපෘතිය ආරම්භ කිරීම තුළින් තම ප්‍රජාවේ පවුල්වල අධ්‍යාපනය හා දායකත්වය තුළින් මෙම ගැටලුව විසඳීමට ප්‍රදීප් තෝරා ගත්තේය.

ඉන්පසුව, ඔහුගේ කණ්ඩායම විසින් සහභාගී වූ 70 දෙනෙකු සඳහා 'සතුටු පවුල්' කඳවුරක් පවත්වන ලදී. තරුණ තරුණියන්, වැඩිහිටියන් සහ රජයේ නිලධාරීන් වැනි විවිධ පාර්ශවකරුවන් මෙයට ඔවුන්ගේ සහාය ලබා දුන්හ. ඔවුන් එක්ව ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ සංවාද සඳහා පහසුකම් සැපයූහ. මෙම සංවාද ප්‍රජාවේ මූලික සාකච්ඡා තුළ අවධානයට ගෙන ආ යුතු යැයි ප්‍රදීප් විශ්වාස කරයි.

ව්‍යාපෘතියේ තෙවන හා අවසාන අංගය ලෙස, කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය හා විශේෂයෙන් ගෘහස්ථ හිංසනය සඳහා මැදිහත් වීම සඳහා 30 දෙනෙකුගෙන් සැදුම්ලත් 'අවදි කණ්ඩායමක්' නිර්මාණය කරන ලදී.

තම ව්‍යාපෘතිය ප්‍රජාවේ පවුල් තුළ ඇති කළ තිරසාර ප්‍රතිඵලය ගැන ප්‍රදීප් සතුටු වේ.

"ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳව මට කිසිම අවබෝධයක් තිබුණේ නෑ. කාන්තාවන් මුහුණ දෙන්නේ ලිංගික හිරිහැරවලට පමණක් නොවෙයි. ඔවුන් ආර්ථික හිංසනයට, ශාරීරික හිංසනයට හා මානසික හිංසනයටද මුහුණ දෙනවා."

**ප්‍රදීප් ප්‍රසන්න,**
සක්‍රීය පුරවැසි,
කෙසෙල්වත්ත, මොණරාගල

"මම පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සේවය කර ඇති අතර ඒවායේ යුද්ධයෙන් තනිකඩ වූ කාන්තාවන් ගණනාවක් සිටිනවා. රූපලාවන්‍ය වැනි විවිධ කුසලතා පිළිබඳව ඔවුන් පුහුණු කළත් ඔවුන් අවාසනාව ගෙන දෙන බවට වැරදි මතයක් පවතින නිසා ඔවුන් පවුලේ කටයුතුවලින් සහ විශේෂ අවස්ථාවන්ගෙන් බැහැර කර තිබෙනවා. මෙය වෙනස් කොට සැලකීමක් හා කොන් කිරීමක්. මෙම ගැටලු විසඳීම සඳහා විවෘත මතධාරී තරුණ තරුණියන් බඳවා ගැනීමට මම බලාපොරොත්තු වෙනවා."

**කොබිනි ඇන්තනී රෙක්ස්,**
සක්‍රීය පුරවැසි,
ශිෂ්‍ය, යාපනය විශ්ව විද්‍යාලය



# ප්‍රජා සුසාධ්‍යකාරකයින්ගේ / පුහුණුකරුවන්ගේ හඬ



"සක්‍රීය පුරවැසියන්ගේ වැඩසටහනෙන් (Active Citizens Programme) ප්‍රජාවේ ගැටලු අවබෝධ කර ගන්නවා. එය පුද්ගලයෙකුගෙන් ප්‍රජාවට තොරතුරු බෙදා හැරීමක්. එය අවබෝධ කර ගැනීමේ ක්‍රියාවලියක්."

**රෙමෝ ශිහාන්,**
සක්‍රීය පුරවැසි පුහුණුකරු

අවබෝධය කෙරෙහි රෙමෝගේ අවධානය ඔහුගේ ක්‍රියාකාරකම්හි අන්තර්ගතව පවතී. රෙමෝ සහ ඔහුගේ සමපුහුණුකාරිනිය වූ සින්තුකා විවේකානන්දන් විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ සංවාද ආරම්භ කළ අතර සංවේදී හෙළිදරව් කිරීම් වලදී ඔහු පන්ති කාමරයෙන් පිටව ගියේ සහභාගිවන්නන්ට එකිනෙකා අතර රහස්‍යභාවය පවත්වා ගැනීමට ඉඩ සලසා දීමටය. සැසිවාරයේදී ඔහුගේ සහභාගීත්වය වැදගත් වන අතර, මෙහිදී ඔහුගේ නික්මයාම සැසිය තව දුරටත් විකාශනය වීමට උපකාරී විය.

"සහභාගිවන්නන්ට පහසුව සැලසීමට පරිසරයට සංවේදී වීම පුහුණුකරුවෙකුගේ වගකීමයි." රෙමෝ පැවසුවේය.

ඔහු සහ සින්තුකා සහභාගිවන්න්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා සක්‍රීය පුරවැසි මෙවලම් කට්ටලයේ (Active Citizens Toolkit) අභ්‍යාස කිහිපයක් භාවිතා කළහ. සහභාගිවන්නන් 'බල ගමන (Power Walk)' අභ්‍යාසය මගින් අධිකාරියේ ධුරාවලිය ගැන ඉගෙන ගත්හ. එහිදී ඔවුහු ඉහළින් හා පහළින් සිටින්නේ කවුරුන්දැයි හඳුනාගත්හ. පසුව පුහුණුකරුවන් සහභාගිවන්නන්ගෙන් ප්‍රශ්න ඇසූ අතර ඔවුන්ට තව දුරටත් අධිකාරය පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා උදාහරණ ඉදිරිපත් කළහ.

"කාන්තාවන් මුහුණ දෙන අභියෝග හෙළිදරව් කිරීම සඳහා අපි ප්‍රශ්න ඇසුවා. ඉන්පසුව පුද්ගලයෙක් ක්‍රියා කිරීමට හේතුව තේරුම් ගැනීම සඳහා අදහස් හුවමාරුවක් ඇතිකළා. අපි මෙය සිතුවිලි උත්තේජනය කිරීමට හා සමාජයේ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කිරීමට ප්‍රායෝගික අවස්ථාවන්ට යොමු කිරීමට භාවිතා කළා." රෙමෝ පැවසුවේය.

ඔහු විසින් යාපනයේ පවත්වන ලද සැසියකදී ඒ. කලයිමගල්ගේ ප්‍රතිචාරයට ඔහුගේ සැලකිල්ල යොමු විය. ඔහුට ඇගේ ශක්තිය හා උද්‍යෝගය විශේෂයෙන් පෙනුණි. ඇය තම වයස නොතකා මානසික හිංසනය වැළැක්වීමට ඇගේ ප්‍රජාව වන නල්ලිනාකපුරම් හි සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමට අදහස් කළාය.

"තරුණ තරුණියන්ට පවා නොමැති ජවයක් ඇය සහ ඇයගේ කණ්ඩායමට තිබුණා. ඔවුන් වෙලාවට වැඩ කරන, කැපවූ සහ ක්‍රියාශීලී පිරිසක්. ඔවුන්ගේ කාර්යභාරයේ වගකීම ඔවුන් ඉතා බැරෑරුම් ලෙස ගත්තා." යි රෙමෝ සඳහන් කළේය.

ඇයගේ සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතිය සඳහා, ඇය සහභාගිවන්නන්ට තම අදහස් ඉදිරිපත් කිරීම සඳහා අන්තර් ක්‍රියාකාරී සැසියක්ද, මානසික හිංසනය පිළිබඳව චිකිත්සක සැසියක්ද, පවුල් සහ වැඩිහිටියන් සඳහා ළමා දින උත්සවයක්ද සංවිධානය කළායග. උත්සව සංවිධානයේදී හා ප්‍රීතිමත් හා සාමකාමී ප්‍රජාවක් බිහි කිරීම සඳහා සාමූහික පියවර ගැනීමේදී ගමේ නිලධාරීන් සහ ප්‍රජා නායකයින් ප්‍රජාවේ වෙනසක් නිරීක්ෂණය කළාය.

"පුද්ගලයන් තේරුම් ගැනීමට සැසි මෙහෙයවීමට මම කැමතියි. මෙම් සැසි සිතුවිලි අවදි කරන අතර සහභාගිවන්නන්ට ඔවුන් සහ ඔවුන්ගේ ප්‍රජාවන් වඩාත් හොඳින් තේරුම් ගැනීමට උපකාර වෙනවා." යි රෙමෝ පැවසුවේය.



"කාන්තාවන් සහ තරුණ තරුණියන්, විශේෂයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට මුහුණ දුන් අය, කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියා කිරීමට පටන් ගැනීම අප නිවැරදි මාවතේ ගමන් කරන බවට ප්‍රබල සාක්ෂියක්. පුහුණුකාරිනියක් ලෙස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණුවේ කොටස්කාරියක් වීමට ලැබීම මට මහත් සතුටක්."

**සින්තුකා විවේකානන්දන්,**
සක්‍රීය පුරවැසි පුහුණුකාරිනී

අයන්ති ද සොයිසා සහ සමපුහුණුකරු ගයාන් රාජපක්ෂ විසින් හම්බන්තොට හා මොණරාගල කාන්තාවන්ට හා තරුණ තරුණියන්ට ප්‍රජා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඔවුහු කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳ සැසි මෙහෙයවීම සඳහා භූමිකා රඟපෑම සහ සංවාදය වැනි නිර්මාණාත්මක ක්‍රම භාවිතා කළහ.

සහභාගිවූවන් ඔවුන් නිවසේදී අත්විඳින ප්‍රචණ්ඩත්වය පළමුව වැළැක්විය යුතු බව වටහා ගත්හ. ක්‍රියාකාරී පුරවැසියන්ගේ (Active Citizens) 'ඉගෙනුම් ගමන' මගින් ආභාෂය ලැබූ ඔවුහු වෙනස ආරම්භ විය යුත්තේ 'මම' තුළින් බව වටහා ගත්හ. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීමට අනෙක් ප්‍රජා සාමාජිකයින්ට උපකාර කිරීම සඳහා ඔවුන්ගේ ධනාත්මක හා යහපත් පෞද්ගලික අත්දැකීම් භාවිතා කළ හැක්කේ එවිට පමණි.

"සහභාගී වූ එක් කාන්තාවක් සහ ඇගේ සැමියා පෙදරේරුවන් වූ අතර ඇය මෙම ව්‍යාපෘතියට සහභාගී වීමට තීරණය කර වැඩට නොපැමිණීම හේතුවෙන් ඇගේ සැමියා ඇයට දඬුවම් කර තිබුණා. එම නිසා එදින රාත්‍රී හය හත වන විට නිවසට පැමිණි ඇයට මධ්‍යම රාත්‍රිය වනතුරු වැඩ කිරීමට සිදුව තිබුණා. මෙම වැඩසටහන නිසා තමාගේ දෑස් පෑදුනු බවත්, ඒ සඳහා පියවර ගත යුතු බව ඇය තේරුම් ගත් බවත් ඇය මට කිව්වා." යයි අයන්ති පැවසුවාය.

සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අයන්ති සහභාගිවන්නන්ගේ ප්‍රජාවේ සන්දර්භය මත පදනම්ව විසඳුම් ලබා දීමට ඔවුන් දිරිමත් කළාය. ඔවුන්ට ව්‍යාපෘතියේ සහ ඔවුන්ගේ ප්‍රජාවේ හිමිකම ලබා ගැනීමට ඇය සහාය වූවාය. සහභාගිවූවන් පළමු දිනයේ කතා කිරීමට මැලි වුමුත්, අවසානයේදී ඔවුන් තම අත්දැකීම් බෙදාහදා ගත් අතර සාමූහික වශයෙන් ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේ ගැටලු නිරාකරණය කළහ. ඊළඟ දින දෙක තුළ, ඔවුන් සිය සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති හරහා ප්‍රජා නායකයින් ලෙස සිය ස්ථාවරය ශක්තිමත් කර ගත්හ.

"අපි ප්‍රජාවට ගිය විට, මෙම ප්‍රජා නායකයින් තම නිවෙස්වලදීද ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට ගොදුරු වන බව අපි දැන ගත්තා. එනමුත් ඔවුන් අනෙක් කාන්තාවන්ට ඇහුම්කන් දී ඔවුන්ටත් උදව් කළා."

**අයන්ති ද සොයිසා,**
සක්‍රීය පුරවැසි පුහුණුකාරිනී




"මම ග්‍රාමීය ප්‍රජාවන්හි බොහෝ කාන්තාවන් හා ගැහැණු ළමයින් සමඟ වැඩ කළා. ඔවුන් තම ජීවිත කාලය පුරාවට විවිධ දුෂ්කරතාවලට මුහුණ දී තිබූ නමුත් පිරිමින්ට වඩා කැපවීම සහ ඉවසීම පෙන්නුම් කළා. මෙම කාන්තාවන්ට තම පවුල් වෙනුවෙන් ඔවුන්ගේම සිහින තිබූ බැවින් ඔවුන් සවිබල ගැන්වීමට උනන්දු වුණා."

**ගයාන් රාජපක්ෂ,**
සක්‍රීය පුරවැසි පුහුණුකරු



# රජයේ පාර්ශවකරුවන්ගේ හඬ

"සහභාගිවන්නන්ගේ චින්තනය වෙනස් වී තිබුණා. ඔවුන් මුහුණ දෙන ගැටලු ගැන වඩාත් විශ්වාසයෙන් හා හඬනගා කතා කරනවා."

**නන්දා දිසානායක,**
වනිතා සංවර්ධන නිලධාරිනී,
බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



අනෙකුත් වනිතා සංවර්ධන නිලධාරීන් මෙන් නන්දා ක්‍රියාත්මක වන්නේද බිම් මට්ටමේ සිටය. ඇය 2018 දී 'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' ව්‍යාපෘතිය ආරම්භ කරන විට එයින් අදහස් ලබා ගෙන ඇගේ ප්‍රජාව තුළ ඇති ගැටලු විසඳීමට බලාපොරොත්තු වූවාය. ව්‍යාපෘතිය හරහා ඇය කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයන්ට හේතු වන විවිධ සාධක සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයෙහි විවිධ ස්වරූපයන් ගැන ඉගෙන ගත්තාය.

"අපි සම්මන්ත්‍රණ කිහිපයක් හරහා නීතිමය ක්‍රියාමාර්ග සහ උපදේශනය පිළිබඳව ඉගෙන ගත්තා. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ දැන ගැනීමට ලැබුණා." යයි ඇය පැවසුවාය. මෙම වැඩසටහන බුත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රජා සාමාජිකයින් වෙත ළඟාවූ දා සිට ඇය ධනාත්මක ප්‍රතිඵල නිරීක්ෂණය කර ඇත. කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීමේ යාන්ත්‍රණයක් ලෙස, සහභාගිවන්නන් මුදල් කළමනාකරණය සහ කුඩා ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳව ඉගෙන ගත්හ.

වගුරුවෙලින් සහභාගී වූ කිහිප දෙනෙක් ආර්ථික බාධක ජය ගැනීම සඳහා කුඩා ව්‍යාපාර ආරම්භ කළහ. ඔවුහු එමගින් ගමේ අනෙකුත් සාමාජිකයින්ට ආදර්ශයක් වූහ. ඔවුහු තම අසල්වැසියන්ට ඔවුන් සමඟ සම්බන්ධ වී සෑම දෙනාට ධනාත්මක පවුල් පරිසරයක් නිර්මාණය කිරීමට දිරිගැන්වූහ.

කාන්තාවන් මීට පෙර ඔවුන්ගේ ගැටලු පිළිබඳව විවෘතව කතා කළේ ඉතාමත්ම කලාතුරකිනි. මෙම වැඩසටහන කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳව සහභාගිවූවන් දැනුවත් කර සේවා සපයන්නන් සමඟ සම්බන්ධ කිරීමත් සමග, ළමා විවාහ, මත්ද්‍රව්‍ය අනිසි භාවිතය සහ ගෘහස්ථ හිංසනය වැනි ගැටලු වලදී උපකාර ලබා ගැනීම සඳහා ඔවුහු කාන්තා සංවිධාන හා සම්බන්ධ වීමට පටන් ගත්හ. මෙම ක්ෂේත්‍රයේ නිලධාරීන්ගෙන් සහභාගිවන්ට වඩා සැලකිලිමත් හා සංවේදී ප්‍රතිචාරයක් තිබූ බව නන්දා දුටුවාය.

නන්දා විශ්වාස කරන්නේ මෙම වැඩසටහන මගින් සේවා සපයන්නන් සහ සහභාගිවන්නන් අතර ඇති සම්බන්ධතාවය ශක්තිමත් වී ඇති බවයි. ඇය මෙම වැඩසටහන බුත්තල පුරාවට ව්‍යාප්ත වනවා දැකීමට කැමත්තෙන් සිටී.

"අපි අද දින වැඩසටහන තුළ අපගේ අත්දැකීම් සහ අදහස් හුවමාරු කර ගත්තා. සහභාගීවූ අය වැඩසටහන නිසා තමන් දුටු ධනාත්මක ප්‍රතිඵල සඳහන් කළා. මෙම වැඩසටහන අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලද පවත්වන්න කියා මම යෝජනා කරනවා."



උදය කුමාරි 'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබල ගැන්වීම' ව්‍යාපෘතිය සඳහා, යාපනයේ පේදුරුතුඩුව මාර්ගයේ කුඩා ගම්මානයක් වන කෝපායිහි කාන්තාවන් සඳහා සැසියක් පැවැත්වූවාය. ඇය සහභාගිවූවන් සමඟ කතා කළ විට, ළමා විවාහ ප්‍රජාව තුළ පවතින ගැටලුවක් බව තේරුම් ගත්තාය.

දෙමව්පියන් අධ්‍යාපනය නොලැබීම සහ ඔවුන් ස්ථාවර රැකියාවක් හෝ සමාජයට වැඩි නිරාවරණයක් නොවීම හේතුවෙන්, ඔවුන්ගේ දරුවන්ට උප්පැන්න සහතික වැනි වැදගත් ලියකියවිලි නොතිබුණු අතර ඔවුහු අකාලයේ පාසල් ගමන් නැවැත්වූහ. මෙයින් අදහස් වන්නේ දරුවන්ද ඔවුන්ගේ දෙමව්පියන් මෙන් දරිද්‍රතා චක්‍රයේ සිරව, කොන් කිරීම සහ සමාජ අපකීර්තියට යටත්ව සිටි බවයි.

උදය කුමාරි මෙයට ප්‍රතිචාර වශයෙන් ළමා විවාහ සහ යොවුන් වියේ ගැබ් ගැනීම පිළිබඳ සැසියක් පැවැත්වූවාය. ඇය ඊට සහභාගි-වූවන්ට තම දරුවන් සඳහා උප්පැන්න සහතිකයක් ලබා ගැනීමට සහාය වූවාය. ඇය පැවැත්වූ සැසිවාරයෙන් පසු දරුවන් දෙදෙනෙකු පාසල ගමන ආරම්භ කිරීමෙන්, ඇගේ සැසිවාරයෙන් ධනාත්මක ප්‍රතිඵලයක් ඇති බව ඇය තේරුම් ගත්තාය.

"අපේ ප්‍රජාවන්හි බාලවියේ විවාහයන් නිසා උපත ලැබූ දරුවන් බොහෝමයක් සිටිනවා. සමහරුන්ට ඔවුන්ගේ දෙමව්පියන්ගේ විවාහ ලියාපදිංචි කර නොමැති නිසා උප්පැන්න සහතික පවා තිබුණේ නෑ. මා කරන වැඩ වලින් මගේ ප්‍රජාවට යහපත් බලපෑමක් ඇති බව මට විශ්වාසයි."

**උදයකුමාරි,**
සක්‍රීය පුරවැසි සහ ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිති සාමාජිකා,
යාපනය







# ජාතික සමුළුව

ජාතික සමුළුව ව්‍යාපෘතියේ යහ භාවිතයන් සහ නිර්දේශයන් බෙදාහදා ගැනීමේ පදනමක් ලෙස ක්‍රියා කළේය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළැක්වීමේ ජාතික සැලැස්මේ ප්‍රතිඵල වඩා හොඳින් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික පාර්ශවකරුවන්ගේ පැමිණීමෙන්, සංවාදය දේශීය සන්දර්භයකින් (දිස්ත්‍රික් මට්ටමින්) ජාතික මට්ටමකට ඔසවා තැබීමට සමත් විය. මෙම ව්‍යාපෘතිය අනාගතයේ දී ප්‍රතිනිර්මාණය කර පුළුල් කිරීමට නම් ජාතික පාර්ශ්වකරුවන්ගේ දායකත්වය සහ සහාය අත්‍යවශ්‍ය වේ.










# නිර්දේශ

ජාතික පාර්ශවකරුවන්ට දිස්ත්‍රික්ක මට්ටමෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ මේවාය.




කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය අවසන් කිරීම සඳහා ක්‍රියාවලින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, කාන්තා හා තරුණ නායකයින්ගේ සහභාගීත්වයට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. නව යොවුන් වියේ ගැහැණු ළමයින් හා පිරිමි ළමයින් සක්‍රීයව සම්බන්ධ කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

කාන්තාවන් ගෘහස්ථ හා ප්‍රජා මට්ටමින් සිදුවන කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර තරුණ තරුණියන් 'මහමඟදී සිදුවන හිරිහැර' හා 'සයිබර් ප්‍රචණ්ඩත්වය' වැනි සමාජ මට්ටමේ මැදිහත්වීම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

තම ප්‍රජාවන්ගේ සංවර්ධනය සඳහා කැපවී සිටින කාන්තාවන් සහ තරුණ තරුණියන් සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතිවලින් ලැබෙන ධනාත්මක ප්‍රතිඵල නැවත සලකා බැලිය යුතුය. පසු විපරම් ක්‍රියාමාර්ග තුළින් තම ප්‍රජාවන් අඛණ්ඩව සවිබල ගැන්වීමට ඔවුන් මූලිකත්වය ගත යුතුය.

නායකත්ව තනතුරු වල කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට එරෙහිව නැගී සිටිමින් කාන්තාවන් වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාකාරීන් ලෙස තීරණ ගන්නන් සහ පාර්ශවකරුවන් වශයෙන් විශේෂයෙන් පිරිමින් සිටිය යුතුය.

ප්‍රජාව, ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ පුළුල් හා නිවැරදි අවබෝධයක් තිබීම ඉතා වැදගත් වේ.

කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ සංචලතාව සීමා කරන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමාජ සම්මතයන්, සමාජ සංස්කෘතික භාවිතයන් සහ සම්ප්‍රදායන් ආමන්ත්‍රණය කිරීම වැදගත් වේ.

දැනුවත්භාවය සහ අවබෝධය ඇති කිරීම සඳහා පාසල් විෂයමාලාවල ස්ත්‍රී පුරුෂ භාවය හා ඒ හා සම්බන්ධ සංකල්ප ඒකාබද්ධ කිරීම අත්‍යවශ්‍ය වේ.

සේවා සැපයීමේ ජාල පුළුල් කිරීම සඳහා සේවා සපයන්නන් සහ ප්‍රජාවන් අතර සම්බන්ධතා ශක්තිමත් කර දැනුවත්භාවය පුළුල් කල යුතු අතර එයට ප්‍රජා නායකයින් සක්‍රීයව සම්බන්ධ කර ගත යුතුය.

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම අරමුණු කරගත් ව්‍යුහගත හා විධිමත් හා පුහුණු සැසි වරින් වර පැවැත්වීම අවශ්‍ය වේ.

කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය සියලු මට්ටමින් වලක්වා ගැනීම සඳහා මැදිහත්වීම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන හා අධීක්ෂණය කරන පද්ධති ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

මෙම නිර්දේශයන්ගේ සංයෝජනය කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ ගෞරවයට ගරු කරන ප්‍රචණ්ඩත්වයෙන් තොර ප්‍රජාවක් සඳහා දායක වේ.

# සම්බන්ධීකාරකවරු




"ව්‍යාපෘතිය සමඟ අපගේ ගමන අප සැමගේ ජීවිත වෙනස් කළ අත්දැකීමක්. ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන් ලෙස, අප වපුරන ලද බීජ ක්‍රමයෙන් පැළ වීමට පටන් ගෙන ඇති අයුරු අපට දැන් දැක ගත හැකියි. වැඩසටහනට සම්බන්ධ වී එය පුරාවට අප හා රැඳී සිටි තරුණ තරුණියන් හා ධෛර්යසම්පන්න කාන්තාවන්ගේ හැකියාවන් හා ඔවුන් සතු විභවය අති විශාලයි. මෙම නිර්දේශයන්ගේ සංයෝජනය කාන්තාවන්ගේ හා ගැහැණු ළමයින්ගේ ගෞරවයට ගරු කරන ප්‍රචණ්ඩත්වයෙන් තොර ප්‍රජාවකට දායක වනු ඇත."

**දිලීෂා ලියනගේ,**
වැඩසටහන් සහකාර සහ ව්‍යාපෘති සම්බන්ධීකාරක, නවෝත්පාද සමාජ සංවර්ධන පදනම
(ඔක්තෝබර් 2018 - මාර්තු 2020)

**ශිවාංජලී සිවශන්මුගපිල්ලෙයි,**
යාපන සමාජ ක්‍රියාකාරී මධ්‍යස්ථානය - යාපනය



**එස්. බාස්කරන්,**
ජනතාක්ෂන් සංවිධානය (Janathakshan), මඩකලපුව





**ප්‍රියන්ත ද සිල්වා,**
නවෝත්පාද සමාජ සංවර්ධන පදනම, මොණරාගල




**රසිකා ස්වර්ණමාලි,**
නවෝත්පාද සමාජ සංවර්ධන පදනම, හම්බන්තොට

# සහභාගීත්වය

පුද්ගලයන් **88,955** ක් සහභාගී වූහ.


'කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රජාවන් සවිබලගැන්වීම' සැසිවාරයන්ගේ ප්‍රතිඵල හා ප්‍රජාව තුළ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය මර්දනය කිරීම සඳහා ආරම්භකළ සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති ප්‍රතිඵල දෙස සමීපව බැලීම මගින් මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵල මැන බැලුණි.




ව්‍යාපෘතියේ විවිධ සැසි වූ වැඩමුළු, සංවාද, 'පිරිමින් දැනුවත් කිරීමේ සැසි' සහ සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති මගින් පළාත් හතරක (යාපනය, මඩකලපුව, මොණරාගල, හම්බන්තොට) පිරිමින් 150 ක්, කාන්තාවන් 150 ක්, තරුණ තරුණියන් 300 ක් සහ ප්‍රාදේශීය සේවා සපයන්නන් 200 ක් සෘජුවම සම්බන්ධ කර ගැනීමට හැකි වී තිබේ. ප්‍රජාවන්හි කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ඔවුන්ගේ ප්‍රජාව තුළ මර්දනය සඳහා මැදිහත්වීමට සහ එයට විසඳුම් සෙවීමට ප්‍රජා නායකයින් 200 ක් දැණුමින් පෝෂණය කර ඇත. ප්‍රජාව දැනුමින් කිරීම සහ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට එරෙහිව පෙනී සිටීම සඳහා මෙම ව්‍යාපෘතිය සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘති 40 ක් ආරම්භ කළේය.

## සමාජ මාධ්‍ය ව්‍යාපාරය

'#HerSafeSpace' සමාජ මාධ්‍ය ව්‍යාපාරය තුළ විවිධ ප්‍රජාවන්හි කාන්තාවන්, පිරිමින් සහ තරුණ තරුණියන්ගේ හිංසනය සහ අයුක්තිය පිළිබඳ කතන්දර බෙදාහදා ගත් අතර එකට එකතු වීම, එකිනෙකා සවිබල ගැන්වීම සහ ඔවුන්ගේ ප්‍රජාවන්හි වෙනසක් ඇති කිරීම පිළිබඳ කතාන්දර ද ඒ අතර විය. මෙම සමාජ මාධ්‍ය ව්‍යාපාරයට පුළුල් ජනකායක් සමඟ මෙම කතන්දර බෙදාගෙන ප්‍රජා නායකයින්ගේ හඬ පතුරවා හැරීමට හැකි විය.



# සක්‍රීය පුරවැසි හඬ



"කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය පිළිබඳ පුහුණුවට සහභාගි වීමෙන් පසුව මම පොදු ස්ථාන වල සිදු වන ලිංගික හිරිහැර පිලිබඳව සමාජ ක්‍රියාකාරී ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළා. මම ඒ සඳහා යොවුන් කඳවුරක් පවත්වා ප්‍රජාව පුරා පත්‍රිකා බෙදාහැරියා. මා විසින් පිටපත ලියා අධ්‍යක්ෂණය කල නාට්‍යයක් ඉදිරිපත් කළා. අපේ ගම්මානයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේ අපේ නාට්‍යය නැරඹීමට මිනිසුන් යොමු කළා. මෙම නාට්‍යය බෙහෙවින් සාර්ථක වූ අතර අපි එය ජාතික සමුළුවේදීද රඟ දැක්වූවා. මගේ නාට්‍යය අපේ ප්‍රජාව තුළ වැදගත් සංවාදයක් ආරම්භ කළා. එහි ප්‍රතිඵලයක් ලෙස තරුණ තරුණියන් බොහෝමයක් තමන්ගේ පුද්ගල සංවර්ධනය හා අධ්‍යාපනය පිළිබඳව අඛණ්ඩව අවධානය යොමු කරමින් ඔවුන්ගේ ජීවිත තවදුරටත් වැඩි දියුණු කරගැනීමට යොමුව සිටිනවා."

**වාසනා සෙව්වන්දි,**
සක්‍රිය පුරවැසි,
වලස්මුල්ල, හම්බන්තොට



"කොක්කඩිචෝලෙයිහි පුහුණු සැසිවාරයක් අවසානයේ එයට සහභාගි වූ කාන්තාවක් ඇගේ සැමියා සමඟ ඔහුගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම ගැන කතා කළා. ඔහු තමා සිටින තත්වය ගැන ඇයට විවෘතව කතා කළා. ඔවුන්ගේ එම සංවාදයට පෙර ඔහුට කිසිදු මඟපෙන්වීමක් තිබුනේ නෑ. ඔවුන්ගේ සංවාදයෙන් පසුව, ඔහු මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකයෙන් උපකාර ලබා ගත්තා. ඔහු මත්පැන් පානය අඩු කිරීමටත්, එහි ප්‍රතිඵලය මාසයක් පුරා පරීක්ෂා කිරීමටත් තීරණය කළා. ඇය තුළ ගොඩනැගුනු නව විශ්වාසයත් සමඟ, ඇය ගැටලුවේ මුල් හේතුව නිරාකරණය කර ගත්තා. ඇගේ ස්වාමිපුරුෂයාට ප්‍රචණ්ඩකාරී හැසිරීමෙන් සම්පූර්ණයෙන් මිදීමට මාස තුනක් ගතවුණා."

**නුස්රත් බෙනාසිර් ෆරූක්,**
මනෝ උපදේශක සහ සක්‍රීය පුරවැසි පුහුණුකාරිනී



"විශේෂයෙන් ප්‍රජාවන්හි කාන්තාවන් සවිබල ගැන්වීම ගැන එක්සත් රාජධානියෙන් සහ ශ්‍රී ලංකාවෙන් ඉගෙන ගත හැකි පාඩම් ගැන මෙනෙහි කිරීමට ජාතික සමුළුව මට උපකාරී වුණා. ශ්‍රී ලංකාව මුහුණ දෙන බොහෝ ගැටලු, විශේෂයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය, එක්සත් රාජධානියේද දක්නට ලැබෙනවා. මෙවන් අභියෝග ජය ගැනීම සඳහා ව්‍යාපෘති රාශියක් තියෙනවා. සමහර බාධක හා අභියෝග ජය ගැනීම සඳහා තමන් සම්බන්ධ වී සිටින ව්‍යාපෘති ගැන බෙදාහදා ගැනීමට හැකි නිසා මෙහිදී ගෝලීයව සම්බන්ධ වීමේ වැදගත්කම ගැන මම තවදුරටත් සිතුවා."

**එඩ් මොස්,**
සක්‍රිය පුරවැසි පුහුණුකරු (එක්සත් රාජධානිය)
2019 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ පැවති ජාතික සමුළුව



“ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් බොහෝමයක් බස් නැවතුම්පොළවල්, බස් රථ, දුම්රිය ස්ථාන සහ මහමඟදී පවා මා දැක තියෙනවා. පිරිමි ළමයින් වශයෙන් අපි ගැහැණු ළමයින්ට අගෞරව කරන්නේ නෑ, නමුත් අපි ඔවුන්ට සලකන ආකාරයෙහි කැපී පෙනෙන වෙනසක් තියෙනවා. ඔවුන් අප හා සමාන හෙයින් ගැහැණු ළමයින්ට ගෞරව කළ යුතු බව මම ඉගෙන ගෙන තියෙනවා. අපගේ ව්‍යාපෘතිය සඳහා අපි තරුණ සමාජ, රාජ්‍ය නොවන සංවිධාන, ගම් සභා සහ දිස්ත්‍රික්ක කාර්යාල සභා සමඟ සම්බන්ධ වී කාන්තාවන් හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය අවම කිරීම සඳහා වැඩසටහන් පැවැත්වූ අතර පත්‍රිකා බෙදා හැරීමද සිදු කළා.”

**ඩබ්ලිව්. එම්. පී. අයි. සඳලංකා,**
සක්‍රීය පුරවැසි,
මඩුල්ල, මොණරාගල

“මගේ ප්‍රජාව තුළ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයන් නැවත නැවතත් සිදුවීමක් දක්නට ලැබෙනවා. වගකිවයුතු පුරවැසියෙකු ලෙස, මගේ ගමේ කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනයට එරෙහිව නැගී සිටීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහාය ලබා ගැනීමට මම අදහස් කරනවා. ප්‍රජාව නොදන්නා සේවා ඇති බව පුහුණුව තුළින් මම සොයා ගත්තා. අප විසින් අවශ්‍ය සම්බන්ධතා ගොඩනගාගත යුතු අතර මෙම ගැටලුව අවම කිරීම හා හිංසනයෙන් තොර සමාජයක් අපට පමණක් නොව අපේ දරුවන්ටද නිර්මාණය කර දීම සඳහා අප එකට වැඩ කරන බවට සහතික විය යුතුයි.”



**ජී. එම්. ධර්මලතා,**
සක්‍රීය පුරවැසි,
බුත්තල, මොණරාගල



“මෙම වැඩසටහන මා දිරිමත් කර ඇති අතර මගේ ආත්ම විශ්වාසය වැඩි දියුණු කළා. මම විවාහක වුවත් දැනට විශ්ව විද්‍යාලයට ඇතුළත්ව සිටිනවා. මම දුෂ්කරතා කිහිපයකට මුහුණ දී සිටින නිසා මගේ අධ්‍යාපනය නැවැත්වීමට සහ මගේ පවුල් සම්බන්ධතාවය කෙරෙහි වැඩි අවධානය යොමු කිරීමට සිතා සිටියා. නමුත් වැඩසටහනෙන් පසුව එය වෙනස් වුණා. තමාව රැකබලා ගැනීමේ හැකියාව හා කුසලතා ලබා ගැනීමට මම මගේ අධ්‍යයන කටයුතු දිගටම කරගෙන යා යුතු බව මම තේරුම් ගත්තා.”

**සිවාජිනි ක්‍රිෂ්ණමූර්ති,**
සක්‍රීය පුරවැසි,
යාපනය විශ්ව විද්‍යාලය

“මම අපේ ප්‍රදේශයේ පැවති ‘පිරිමින් දැනුවත් කිරීමේ සැසිවාරයට’ සහභාගි වුණා. එය විනෝදාත්මක වැඩසටහනක්. වොලිබෝල් තරඟයක්, ඉවුම් පිහුම් තරඟයක් සහ සංගීත වැඩසටහනක් පැවැත්වුණා. අපි එහිදී කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය හා සම්බන්ධ පොදු ගැටලු හඳුනාගැනීමට හා වගකීමෙන් යුතුව එයට ප්‍රතිචාර දැක්වීමට අප ගත යුතු පියවර පිළිබඳව සාකච්ඡා කළා. මම නැවත මගේ ප්‍රජාවට පැමිණි දා සිට වඩාත් නිරීක්ෂණයෙන් හා අවබෝධයෙන් යුතුව ක්‍රියා කරනවා. මම ඉගෙන ගත් දේ මගේ පවුලේ අය හා මිතුරන් සමඟ බෙදා ගත්තා.”



**කේශාන් ධීරසිංහ,**
සක්‍රීය පුරවැසි,
වීරකැටිය, හම්බන්තොට

# හදිසි ඇමතුම් අංක

ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය පිළිබඳ වැඩි විස්තර සඳහා සම්බන්ධ වීමට හදිසි ඇමතුම් අංක:

කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

කාන්තා සහය අංකය
**1938**

ළමා සහය අංකය
**1929**


කාන්තා පිහිට (Women In Need)
**0775676555**

ශාන්ති මාර්ගම් (Shanthi Maargam)
**0717639898**

ග්‍රාස්රූට්ඩ් පදනම (Grassrooted Trust)
**+94763488622** *(text)*

ජාතික ගමනාගමන කොමිෂන් සභාව - මහජන පැමිණිලි
**1955**

සයිබර් ආරක්ෂාව පිළිබඳ ජාතික මධ්‍යස්ථානය
National Centre for Cyber Security (CERT)
**0112691692 / 0112679888**
report@cert.gov.lk



© British Council 2020

බ්‍රිතාන්‍ය කවුන්සිලය යනු එක්සත් රාජධානියේ සංස්කෘතික සබඳතා හා අධ්‍යාපනික අවස්ථා සඳහා වන ජාත්‍යන්තර සංවිධානයයි.

9 789559 055549